# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2319/40 - 2023 පෙබරවාරි මස 14 වැනි අඟහරුවාදා - 2023.02.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 11/80 (30)

### 1980 අංක 26 දරන ආහාර පනත

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වන වගන්තිය යටතේ ආහාර උපදේශක කමිටුව විමසා සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**කෙහෙළිය රඹුක්වැල්ල,**
සෞඛ්‍ය අමාත්‍ය.

2023 ජනවාරි මස 17 දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2022 ආහාර (ලේබල් කිරීමේ සහ ප්‍රචාරය කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර මෙම නියෝග 2024 ජනවාරි මස 01 වැනි දින සිට බලාත්මකභාවයට පත්විය යුතු ය.

2. යම් ඇසුරුමක් හෝ බහාලුවක් මෙම නියෝගවලට අනුකූලව ලේබල් කර ඇත්නම් මිස එවැනි ඇසුරුමක හෝ බහාලුවක ඇතුළත් කරන ලද යම් ආහාරයක් කිසිදු තැනැත්තකු විසින් ආනයනය කිරීම, ප්‍රවාහනය කිරීම, බෙදාහැරීම, ගබඩා කිරීම, විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ විකිණීම පිණිස තබාගැනීම හෝ විකිණීම සඳහා ප්‍රචාරණය කිරීම නොකළ යුතු ය:

එසේ වුව ද, මෙම නියෝග, ගැනුම්කරු විසින් ඉල්ලා සිටින ස්වභාවයේ, තත්ත්වයේ, ප්‍රමාණයේ, සම්භවයේ හෝ වර්ගයේ සහ ගැනුම්කරු ඉදිරිපිට දී බර කිරා, ගණනය කර හෝ මැන බලා දෙනු ලබන ආහාරයක් සම්බන්ධයෙන් නම්, සිල්ලර අලෙවිය සඳහා ඉදිරිපත් කරන ලද යම් ඇසුරුමක් සඳහා අදාළ නොවිය යුතු ය.

1A - PG 6221 — 4506 (2023/02)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

3. (1) ඇසුරුමක හෝ බහාලුවක අඩංගු ආහාරය සම්බන්ධයෙන් පැහැදිලිව සහ ප්‍රකටව පෙනෙන ලේබලයක් එම ඇසුරුමේ හෝ බහාලුවේ තිබිය යුතු ය.

(2) නිෂ්පාදකයා, ඇසුරුම්කරු හෝ බෙදාහරින්නා විසින් ලේබලය, ඇසුරුමේ හෝ බහාලුවේ නොමැකෙන ලෙස මුද්‍රණය කිරීම හෝ පින්තාරු කිරීම හෝ සුරක්ෂිතව ඇලවීම සිදු කළ යුතු ය.

(3) නිෂ්පාදකයා හෝ ඇසුරුම්කරු විසින් මුද්‍රණය කළ, පින්තාරු කළ හෝ ප්‍රදර්ශනය කළ මුල් නිෂ්පාදිත දිනය, ඇසුරුම් කළ දිනය හෝ කල් ඉකුත්වීමේ දිනය කිසිදු තැනැත්තකු විසින් දූර්වර්ණ කිරීම, විකෘති කිරීම, මකා දැමීම හෝ කටු ගා දැමීම සිදු නොකළ යුතු ය.

(4) ආනයනික ආහාර ඇසුරුමක් හෝ බහාලුවක් මත භාෂා තුනෙන් ඕනෑම එක් භාෂාවකින් ලේබලයක් අලවා ඇති අවස්ථාවක දී සහ මෙම නියෝගවලට අනුකූලව ඒ ඇසුරුම හෝ බහාලුම මත අනෙක් භාෂා දෙකෙන් කැපී පෙනෙන ලෙස ප්‍රකටව සහ පැහැදිලිව ඝන අකුරින් අතිරේක ලේබලයක් නොමැකෙන ලෙස මුද්‍රණය කොට හෝ පින්තාරු කොට හෝ ආරක්ෂිතව අලවා ඇති විට මෙම නියෝගවල නියමයන් සැහීමට පත් කිරීම සඳහා එය ප්‍රමාණවත් විය යුතු යඃ

එසේ වුව ද, මෙම නියෝගවල 3(4) වන නියෝගය යටතේ වන විධිවිධානවලට අනුකූලවීමේ කාර්යය සඳහා ඒ අතිරේක ලේබලය අලවා ඇති අවස්ථාවක දී ඒ අතිරේක ලේබලයේ නිෂ්පාදිත දිනය, ඇසුරුම් කළ දිනය හෝ කල් ඉකුත්වීමේ දිනය සහ වෙනත් අනිවාර්ය තොරතුරු සම්බන්ධයෙන් වන තොරතුරු ඇතුළත් වේ නම් ඒ අතිරේක ලේබලයේ නිෂ්පාදිත දිනය, ඇසුරුම් කළ දිනය, කල් ඉකුත්වීමේ දිනය සහ නිෂ්පාදකයා හෝ ඇසුරුම්කරු විසින් ප්‍රකාශ කළ යුතු බවට නියම කළ වෙනත් තොරතුරු විකෘති නොවන, දූර්වර්ණ නොවන, මකා නොදමන හෝ කටු ගා නොදමන ආකාරයකින් සුරක්ෂිතව ඇලවිය යුතු යඃ

එසේ වුව ද, රේගු නිෂ්කාශනයට පෙරාතුව මෙම නියෝගවලට අනුකූල වීමේ කාර්යය සඳහා රේගුව විසින් බලය පවරන ලද ගබඩාවකට ප්‍රවාහනය කරනු ලබන හෝ ගබඩාවක තබා ඇති ආනයනික නිෂ්පාදන, 2 වන නියෝගය යටතේ වූ නියමයන්ගෙන් නිදහස් වේ.

4. (1) පහත දැක්වෙන ප්‍රකාශන ඇසුරුමේ හෝ බහාලුවේ ප්‍රධාන රාමුව මත නොමැකෙන සහ පැහැදිලිව කියවිය හැකි ලෙස සඳහන් විය යුතු ය-

(අ) නිෂ්පාදනයේ පොදු නම ඝන අකුරින් භාෂා තුනෙන් ම;

එසේ වුව ද, පොදු නාමය වෙනුවට මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති පරිදි වෙනත් යම් නාමයක් ආදේශ කරනු ලැබිය හැකි ය.

(ආ) යම් තැනැත්තකු මුලාවට පත් කරනු ලබන හෝ නොමඟ යවනු ලබන නොවන යම් ආකාරයකින් වෙළඳ නාමය සහ වර්ග නාමය (ඇත්නම්) භාෂා තුනෙන් එක් භාෂාවකින් හෝ වැඩි ගණනකින්;

එසේ වුවද, මෙම නියෝගවල කාර්යය සඳහා-

(i) වෙනත් ආහාර නිෂ්පාදනයක් හෝ කාණ්ඩයක් හඳුනා ගැනීම සඳහා යොදා ගන්නා පොදු නාමයක්;

(ii) කිසියම් ආහාරයක භෞතික විද්‍යාත්මක, ජෛව රසායනික හෝ මනෝ විද්‍යාත්මක ක්‍රියාකාරීත්වයක්;

(iii) සෞඛ්‍යමය බලපෑමක් හෝ ප්‍රතිඵලයක්,

ඍජුව හෝ වක්‍රව හඟවනු ලබන යම් වර්ග නාමයක් හෝ වෙළඳනාමයක් මගින් පාරිභෝගිකයා මුලාවට පත් කරනු ලබන බවට හෝ නොමඟ යවනු ලබන බවට සැලකිය යුතු ය.

(ඇ) ඇසුරුමේ හෝ බහාලුවේ ශුද්ධ අන්තර්ගතය SI ඒකක වලින් හෝ ජාත්‍යන්තර සංකේත වලින් ඝන ද්‍රව්‍ය සම්බන්ධයෙන් 'g' හෝ 'kg' වශයෙන් ද, ද්‍රව සම්බන්ධයෙන් නම් "ml" හෝ "l" වශයෙන් සහ ද්‍රව මාධ්‍යයෙන් අසුරා ඇත්නම්, දියර ඉවත් කළ ශුද්ධ බර "g" හෝ "kg" වශයෙන් ද සඳහන් කළ යුතු ය.

(2) (*අ*) පහත දැක්වෙන ප්‍රකාශන භාෂා තුනෙන් ඕනෑම එක් භාෂාවකින් හෝ ඊට වැඩි ගණනකින් ඕනෑම රාමුවක් මත නොමැකෙන සහ පැහැදිළිව කියවිය හැකි පරිදි සඳහන් කළ යුතු ය-

(i) පහත යටතේ සාදන ලද නියෝගවලින් නියම කරනු ලැබිය හැකි INS අංකවලින් සහ පොදු නමින් සඳහන් කරනු ලබන යම් අනුමත ආහාර ආකලන ද්‍රව්‍ය ඇතුළු ආහාර නිෂ්පාදන අවස්ථාවේ දී එහි අඩංගු ද්‍රව්‍ය යොදාගනු ලබන බර ප්‍රමාණයන්ට අනුව (m/m) අවරෝහණ පිළිවෙළට ඒවායේ පොදු නම්වලින් යුත් සම්පූර්ණ ලැයිස්තුවක්:

එසේ වුව ද, අවසාන නිෂ්පාදනයට එකතු නොවන ආහාර සැකසුම් ආධාරක ද්‍රව්‍ය, ද්‍රව්‍ය පිළිබඳ ලැයිස්තුවේ ප්‍රකාශ කිරීමෙන් නිදහස් වේ;

(ii) (*අ*) නිෂ්පාදකයාගේ සහ බෙදාහරින්නාගේ නම සහ ලිපිනය සහ ආනයනික ආහාර සම්බන්ධයෙන්, ආනයනකරුගේ නම සහ ලිපිනය;

(*ආ*) ඇසුරුම්කරුගේ නම සහ ලිපිනය (එසේ ඇත්නම්);

(iii) කාණ්ඩ අංකය හෝ සංකේත අංකය හෝ රහස් සංකේත සටහන;

(iv) නිෂ්පාදිත දිනය;

(v) කල් ඉකුත්වීමේ දිනය;

(vi) ආහාර තොග වශයෙන් ආනයනය කර නැවත ඇසුරුම් කිරීමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී නිෂ්පාදිත දිනය සහ නැවත ඇසුරුම් කළ දිනය;

(vii) ආනයනික ආහාර සම්බන්ධයෙන් නිෂ්පාදිත රට;

(viii) මි.මි. 1.5ට නොඅඩු අකුරු ප්‍රමාණයෙන් වූ පෝෂණ ලේබල:

(ix) මෙම නියෝග යටතේ නියම කළ වෙනත් යම් ප්‍රකාශනයන්;

(*ආ*) පහත යටතේ යම් නියෝගවල පාරිභෝගික අවවාද නිශ්චිතව දක්වා ඇත්නම්, ඒවා මි.මි. 1.5කට නොඅඩු ප්‍රමාණයේ අකුරුවලින් භාෂා තුනෙන් සඳහන් කළ යුතු ය;

(*ඇ*) කල් ඉකුත්වීමේ දිනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ඕනෑම භාෂා දෙකකින්, ඕනෑම රාමුවක් මත සඳහන් කළ යුතු ය;

එසේ වුව ද, බෝතල් කළ ආහාර නිෂ්පාදන සම්බන්ධයෙන්, කල් ඉකුත් වීමේ දිනය, කාණ්ඩ අංකය සහ නිෂ්පාදිත දිනය මිලිමීටර් 1.5ට නොඅඩු ප්‍රමාණයේ අකුරු භාවිතා කරමින් බෝතල් ගෙල මත නොමැකෙන ලෙස සහ පැහැදිලි ලෙස මුද්‍රා තබනු ලැබිය හැකි ය. ආහාර අඩංගු ලෝහ භාජන සම්බන්ධයෙන් වනවිට කල් ඉකුත් වීමේ දිනය, කාණ්ඩ අංකය සහ නිෂ්පාදිත දිනය, එම භාජනයේ මුදුනේ හෝ පතුලේ ඇති පියන් මත නොමැකෙන ලෙස සහ පැහැදිලි ලෙස ප්‍රදර්ශනය කළ යුතු ය;

එසේ වුව ද, තවදුරටත් තොග අලෙවිය සඳහා වූ ඇසුරුම්වල ඇති සීනි, තේ, ධාන්‍ය හා ඇට වර්ග, නැවුම් එළවළු, පළතුරු, මූලාහ සහ ස්කන්ධාහ වශයෙන් ඇති අලවර්ග සහ පෙති කපන ලද පාන් හැර අනෙකුත් පාන් සඳහා කල් ඉකුත්වීමේ දිනය සඳහන් කිරීම අවශ්‍ය නොවිය හැකි ය;

(*ඈ*) ගබඩා කිරීම සහ භාවිතය සඳහා උපදෙස් ඇත්නම් භාෂා තුනෙන් අවම වශයෙන් භාෂා දෙකකින් එම උපදෙස් සඳහන් කළ යුතු අතර ඇසුරුමේ මතුපිට ප්‍රදේශය කුඩා වන අවස්ථාවක දී භාෂාවන් දෙක යොදා ගැනීම සම්බන්ධයෙන් යම් නිදහස් කිරීම් ප්‍රධාන ආහාර බලධරයා විසින් එක් එක් අවස්ථාව මත පදනම්ව ලබා දිය හැකි ය.

(3) බර ග්‍රෑම් 25ක් හෝ පරිමාව මිලිලීටර් 30ක් නොඉක්මවන කලින් ඇසුරුම් කළ ආහාර නිෂ්පාදන සම්බන්ධයෙන් එම ආහාර සිරිත් පරිදි ගැනුම්කරුට විකුණනු ලබන නිමුදන ඇසුරුම හෝ බඳුන, විකුණනු ලබන අවස්ථාවේ දී පවතී නම් සහ එය මෙම නියෝගවලට අනුකූලව ලේබල් කර ඇත්නම් ඒවා සඳහා මෙම නියෝගවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(4) යම් ආහාරයක් එහි කල් ඉකුත් වන දිනයෙන් පසුව කිසිඳු තැනැත්තකු විසින් විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ තබා ගැනීම, විකිණීම සඳහා ප්‍රවාහනය කිරීම සිදු නොකළ යුතු ය.

(5) තේ, කුළුබඩු, කෑමට ගන්නා තෙල්, කෑමට ගන්නා ලුණු, ධාන්‍ය, සම්පූර්ණ හෝ පියලි කළ රනිල බෝග ඇට සහ කෑමට ගන්නා තෙල් සිඳින ඇට වර්ග සම්බන්ධයෙන් ඇසුරුම් කළ දිනය නිෂ්පාදිත දිනය ලෙස සලකනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, ඇසුරුම්කරු විසින්, නිෂ්පාදනය ඇසුරුම් කරන අවස්ථාවේ දී මනුෂ්‍ය පරිභෝජනය සඳහා එය හිතකර බවට සහ පිරිපුන් නිෂ්පාදනයක් බවට සහතික විය යුතු ය.

(6) IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි පෝෂණ ලේබලය ඇලවීම අනිවාර්ය විය යුතු ය.

5. 4 වන නියෝගයේ කාර්යය සඳහා-

(*අ*) පොදු නාමය සඳහා භාවිතා කරනු ලබන අකුරුවල ප්‍රමාණය වෙළඳ නාමය හෝ වර්ග නාමයෙන් වැඩි විශාලත්වයෙන් යුත් කවර හෝ නාමය සඳහා භාවිතා කරන අකුරුවල ප්‍රමාණයෙන් තුනෙන් එකකට වඩා නොඅඩු මෙන්ම මිලිමීටර් 3ක අවම උසකින් විය යුතු ය. පොදු නාමය එක වචනයකින් හෝ එක වචනයකට වඩා වැඩි වචන ගණනකින් සමන්විත වේ නම් ඒ වචනය හෝ වචන (අවශ්‍ය පද, සන්ධි හෝ නිපාත හැර) සමාන මෝස්තරයෙන් සහ ප්‍රමාණයෙන් විය යුතු අතර, එකම ආකාරයෙන් දැක්විය යුතු ය.

(*ආ*) 3 (4) වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි අතිරේක ලේබලයේ පොදු නාමය සඳහා භාවිත කළ අකුරුවල උස ප්‍රමාණය මිලිමීටර් 3ක අවම උසකට යටත් ව ඒ ඇසුරුමේ හෝ බහාලුවේ ප්‍රධාන රාමුව මත වූ පොදු නාමය සඳහා භාවිත කළ අකුරු වල උස ප්‍රමාණයෙන් දෙකෙන් එකකට වඩා අඩු නොවිය යුතු ය.

(*ඇ*) ලේබලය මත වූ අකුරු, සංඛ්‍යා සහ සංකේත කියවිය හැකි සහ පියවි ඇසට පෙනෙන පරිදි විය යුතු අතර ඒවායේ පසුතල වර්ණ හා ගැලපීමේ දී කැපී පෙනෙන ලෙස හඳුනාගත හැකි විය යුතු ය.

(*ඈ*) 4 වන නියෝගයේ ශුද්ධ අන්තර්ගතයන්, නිෂ්පාදිත දිනය සහ කල් ඉකුත්වීමේ දිනය ප්‍රකාශ කිරීම සඳහා භාවිත කරනු ලබන අකුරු ඝන අකුරින් විය යුතු අතර, II වන උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දක්වා ඇති ලේබලයේ ප්‍රධාන රාමුවේ ඉඩ ප්‍රමාණය සම්බන්ධයෙන් මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උස ප්‍රමාණයට වඩා අඩු නොවිය යුතු ය.

(*ඉ*) 4(1) වන, 4(2) (අ)(iv) වන සහ 4(2)(අ)(v) වන නියෝගවල ප්‍රකාශන නොවන ප්‍රකාශ උසින් මිලිමීටර් 1.5කට නොඅඩු පැහැදිලි ඝන අකුරින් ප්‍රකටව පෙනෙන පරිදි මුද්‍රණය කරනු ලැබිය යුතු ය.

(*ඊ*) (i) ඇසුරුමක හෝ බහාලුවක අඩංගු ආහාර සම්බන්ධයෙන් කල් ඉකුත් වීමේ දිනය-

(*අ*) දිනය, මාසය සහ වර්ෂය;

(*ආ*) වර්ෂය, මාසය සහ දිනය; හෝ

(*ඇ*) මාසය සහ වර්ෂය යන

ආකාරයකින් ප්‍රකාශ කළ යුතු ය.

(ii) වර්ෂය අංක හතරකින් ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක දී, දිනය, මාසය සහ වර්ෂය හෝ වර්ෂය, මාසය සහ දිනය යන දෙයාකාරයෙන් එක් ආකෘතියකින් ප්‍රකාශ කළ හැකි ය.

(iii) වර්ෂය අංක දෙකකින් ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක දී, ආකෘතිය දිනය, මාසය සහ වර්ෂය; හෝ වර්ෂය, මාසය සහ දිනය විය යුතු වුව ද, අවස්ථාවෝචිත පරිදි, දිනය, මාසය සහ වර්ෂය නියෝජනය කරන දි/මා/ව යන සංඥා හෝ වර්ෂය, මාසය සහ දිනය නියෝජනය කරන ව/මා/දි යන සංඥා අංකවලට ඉහලින් හෝ එයට ඉතා ආසන්නව මුද්‍රණය කරනු ලැබිය යුතු ය.

(iv) කල් ඉකුත්වීමේ දිනය ලෙස මාසය සහ වර්ෂය පමණක් දක්වන අවස්ථාවක දී ආකෘතිය මාසය සහ වර්ෂය; හෝ වර්ෂය සහ මාසය ලෙස දැක්විය යුතු වුව ද අවස්ථාවෝචිත පරිදි, මාසය සහ වර්ෂය නියෝජනය කරන මා/ව යන සංඥාව හෝ වර්ෂය සහ මාසය නියෝජනය කරන ව/මා යන සංඥාව අංකවලට ඉහලින් හෝ එයට ඉතා ආසන්නව මුද්‍රණය කරනු ලැබිය යුතු ය.

(v) කල් ඉකුත්වීමේ දිනය ලෙස මාසය සහ වර්ෂය පමණක් දක්වන අවස්ථාවක දී ඒ නිෂ්පාදනය කල් ඉකුත්වීමේ දිනය ඒ මාසය අවසන් වන දිනය ලෙස සලකනු ලැබිය යුතු ය.

(vi) කල් ඉකුත්වීමේ දිනය, "කල්ඉකුත් වීම" හෝ "දිනට පෙර භාවිතා කරන්න" හෝ "භාවිතා කළ යුතු" හෝ "දිනට පෙර ඉතා සුදුසුයි", යන වචන හෝ සිංහලෙන් "කා.ඉ.දි" හෝ දෙමළෙන් "கா.தேதி" යන්න සමඟ ඉංග්‍රිසි බසින් "Exp" යන කෙටි නාමයට පසුව ඉලක්කමෙන් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

(ඇ) (i) ඇසුරුමක හෝ බහාලුවක අඩංගු ආහාර සම්බන්ධයෙන් නිෂ්පාදිත දිනය (අ) දිනය, මාසය සහ වර්ෂය; හෝ (ආ) වර්ෂය, මාසය සහ දිනය යන ආකාරයෙන් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

(ii) වර්ෂය ඉලක්කම් හතරකින් ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක දී, එය දිනය, මාසය සහ වර්ෂය හෝ වර්ෂය, මාසය සහ දිනය යන දෙයාකාරයෙන් එක් ආකෘතියකින් විය හැකි ය.

(iii) වර්ෂය ඉලක්කම් දෙකකින් ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක දී, ආකෘතිය දිනය, මාසය සහ වර්ෂය; හෝ වර්ෂය, මාසය සහ දිනය වශයෙන් දැක්වුව ද අවස්ථාවෝචිත පරිදි දිනය, මාසය සහ වර්ෂය නියෝජනය කරන DD/MM/YY යන සංඥාව හෝ වර්ෂය, මාසය සහ දිනය නියෝජනය කරන YY/MM/DD යන සංඥාව අංකවලට ඉහලින් හෝ අංකවලට ඉතා ආසන්නව මුද්‍රණය කරනු ලැබිය යුතු ය.

(iv) නිෂ්පාදිත දිනය, "නිෂ්පාදනය කරන ලද දිනය" හෝ "නිෂ්පාදිත දිනය" හෝ "නිෂ්පාදනය කළ" යන වචන හෝ සිංහලෙන් "නි.දි" හෝ දෙමළෙන් "உ.தேதி." යන්න සමඟ ඉංග්‍රීසි බසින් "MFD" යන කෙටිනාමයට පසුව ඉලක්කමෙන් ප්‍රකාශ කළ යුතු ය.

6. (1) යම් කෑමට සුදුසු තෙල් (යම් පිරිපහදු කළ තෙල් ඇතුළත්ව) සම්බන්ධයෙන් ඒවායේ පොදු නාමය සහ ඊට ආසන්නයේ ඒවා ලබා ගන්නා ලද (ප්‍රභවය) පැහැදිලිව සහ ප්‍රකටව පෙනෙන ලෙස අකුරුවල වර්ගය, ප්‍රමාණය සහ වර්ණය එක සමාන වන ආකාරයෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.

(2) (අ) යම් සීනි රසකැවිලි හෝ චොකලට් නිෂ්පාදනයක විස්තරයක, එම රසකැවිලි හෝ චොක්ලට් නිපදවීම සඳහා යොදාගනු ලබන මේද ප්‍රමාණයේ බරින් සියයට හතරකට (4%) නොඅඩු ප්‍රමාණයක් බටර් මේදය අන්තර්ගත වන්නේ නම්;

(ආ) යම් පිටි රසකැවිලි නිෂ්පාදනයක විස්තරයක, එම රසකැවිලි නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන මේදය මුළුමනින්ම බටර් මේදයෙන් සමන්විත වන්නේ නම්,

මිස එම ලේබලයේ "බටර්" යන නම ඒ සඳහා යොදා නොගත යුතු අතර, ඊට සමාන පදයක් හෝ බටර් අන්තර්ගත වන බව හැඟවෙන කුමන හෝ වචනයක් සඳහන් නොකළ යුතු ය.

7. (1) පෙර ඇසුරුම් කරනු ලැබූ ආහාරයක කුමන හෝ ලේබලයක් වෙනත් නිෂ්පාදනයක් සමඟ ව්‍යාකුල වන ආකාරයට එම නිෂ්පාදනය ඍජුව හෝ වක්‍රව සඳහන් කිරීමක් හා ඇඟවීමක් සිදුවන ආකාරයට හෝ එවැනි නිෂ්පාදනයක් සමඟ එම ආහාරය සම්බන්ධ වන බවට මිලදීගන්නා හෝ පාරිභෝගිකයා නොමඟ යවන ආකාරයට වචනයෙන්, චිත්‍රයෙන් හෝ වෙනත් මාර්ගයක් මගින් විස්තර කිරීමක් හෝ ඉදිරිපත් කිරීමක් නොකළ යුතු ය.

(2) ඍජුව හෝ යළි සකස් කොට පානය කිරීම සඳහා පළතුරුවලින් සකස් කොට ඇති කිසිදු පානවර්ගයක් මෙහි III වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයන්ට අනුව එම පළතුරෙහි පළතුරු යුෂ ප්‍රමාණයක් අන්තර්ගත වේ නම් මිස එය නියම පළතුරු වලින් සකස් කළ පානයක් ලෙසට කවර හෝ ලේබලයක හෝ දැන්වීමක විස්තර නොකළ යුතු අතර, එය අවස්ථාවෝචිත පරිදි, "කෘත්‍රිම සිරප්", "කෘත්‍රිම කෝඩියල්" හෝ "කෘතිම පාන" වශයෙන් විස්තර කළ යුතු ය.

(3) ශාක නිෂ්පාදන පැසවීම මගින් නිෂ්පාදනය කරන ලද අවස්ථාවක දී හැර, යම් විනාකිරි බෝතලයක් හෝ බඳුනක් "කෘත්‍රිම විනාකිරි" ලෙස ලේබල් කළ යුතු ය.

(4) මේ නියෝගවල (2) වන සහ (3) වන ඡේදවල "කෘත්‍රිම" යනුවෙන් සඳහන් කරන ලද යම් ආහාර නිෂ්පාදනයකට අදාළ යම් ලේබලයක හෝ වෙළඳ දැන්වීමක-

(අ) නිෂ්පාදනයේ නාමයට ඉතාම සමීපව, "කෘත්‍රිම" යන වචනය පැහැදිලිව සහ ප්‍රකටව පෙනෙන ලෙස සඳහන් කළ යුතු අතර එම වචනයේ අකුරුවල වර්ගය, වර්ණය සහ ප්‍රමාණය නිෂ්පාදනයේ පොදු නාමය සඳහා යොදාගනු ලබන අකුරුවල වර්ගයේ, වර්ණයේ සහ ප්‍රමාණයේ ම විය යුතු ය.

(ආ) එවැනි නිෂ්පාදනයක විස්තරයක "පළතුරු" යන වචනය සඳහන් කිරීම හෝ යම් පළතුරක චිත්‍රයක් මගින් නිරූපණයක් එහි දැක්වීම නොකළ යුතු ය.

(ඇ) විනාකිරිවලට සම්බන්ධ කුමන හෝ ශාකයක් හෝ ශාක නිෂ්පාදනයක් ගැන චිත්‍රයක් මගින් නිරූපණය නොකළ යුතු ය.

8. (1) රසකැවිලි, චොකලට් හෝ විස්කෝතු හෝ ඒ හා සමාන නිෂ්පාදනවල පළතුරු මිශ්‍ර නොවන අවස්ථාවක දී සහ ස්වභාවික හෝ කෘත්‍රිම රසගැන්වූ පාන වර්ග මිශ්‍රණවල, ජෙලි ක්‍රිස්ටල් සහ පුඩින් මිශ්‍රණවල පළතුරු මිශ්‍ර නොවන අවස්ථාවක දී පළතුරක හෝ පළතුරුවල නම් හෝ පළතුරක් හෝ පළතුරු නියෝජනය කරන පින්තූරයක් ලේබලය මත අලවනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, පළතුරු මිශ්‍ර නොකළ ස්වභාවික හෝ කෘත්‍රිම රස ගැන්වූ පාන වර්ග මිශ්‍රණ, ජෙලි ක්‍රිස්ටල් සහ පුඩින් මිශ්‍රණ සම්බන්ධයෙන් වන කාරණාවක දී,"x" රස ගැන්වූ පාන වර්ග මිශ්‍රණය/ජෙලි ක්‍රිස්ටල්/පුඩින් මිශ්‍රණය යන පොදු නාමය, පළතුරුවල නම හෝ නාමයන් "x" වන අවස්ථාවක දී ලේබලයේ ප්‍රධාන රාමුව මත සඳහන් කරනු ලැබිය යුතු ය.

(2) රසකාරක ද්‍රව්‍ය හැර ආහාරයක අන්තර්ගත ද්‍රව්‍යයක් හෝ සංඝටකයක් ආහාරයක නාමය සමඟ සඳහන් කරනු ලබන විට හෝ ආශ්‍රිතව සඳහන් වන විට හෝ වචනවලින්, පින්තූරවලින් හෝ ප්‍රස්ථාරවලින් ලේබලයේ අවධාරණය කර ඇති විට එහි අනුපාතය අන්තර්ගත ද්‍රව්‍යයන්ගේ ප්‍රතිශතයක් ලෙස ද්‍රව්‍යවල හෝ සංඝටකවල පොදු, විස්තරාත්මක හෝ ගණ නාමයට ඉක්බිතිවම ලේබලයේ ප්‍රකාශ කළ යුතු ය. උදා:- "x" නූඩ්ල්ස්, "x" යනු අන්තර්ගත ද්‍රව්‍ය වේ.

9. (1) ආහාර පනත යටතේ සාදන ලද යම් නියෝගවල යම් ආහාරයක් සඳහා ප්‍රමිතියක් නිශ්චිතව සඳහන් කර ඇති අවස්ථාවක දී ඒ ප්‍රමිතීන්ට අනුව නම් කරනු ලැබිය හැකි යම් ද්‍රව්‍ය පමණක් ඒ ආහාරය සඳහා යොදාගත යුතු ය. වෙනත් යම් ද්‍රව්‍ය එකතු කිරීමක් හෝ සම්මිශ්‍රණය කිරීමක් එම ද්‍රව්‍ය සම්බන්ධව ලේබලයක් හෝ ප්‍රකාශයක් ඇතිව හෝ නැතිව සිදු කිරීම තහනම් විය යුතු ය.

(2) ආහාර පනත යටතේ සාදන ලද යම් නියෝගවලින් යම් ප්‍රමිතියක් නිශ්චිතව දක්වා නොමැති යම් ආහාරයක එකතු කිරීමක්, සම්මිශ්‍රණය කිරීමක් අඩංගු වන හෝ යම් ඌනතාවයක් පවතින අවස්ථාවක දී ඒ ආහාරයට අදාල වන ලේබලය හෝ දැන්වීම ඒ එකතු කිරීම, සම්මිශ්‍රණය කිරීම හෝ ඌනතාවය පිළිබඳ ප්‍රකාශයක් අඩංගු කළ යුතු අතර ඒ ප්‍රකාශයේ අවස්ථාවෝචිත පරිදි එකතු කළ හෝ සම්මිශ්‍රණය කළ හෝ ඌනතාවක් පවතින ද්‍රව්‍යයේ නාමය සහ ප්‍රතිශතය පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(3) (අ) ආහාර නිෂ්පාදනයකට පැණිරස කාරකයන් එකතු කර ඇති අවස්ථාවක දී, මි.මි. 1.5ක අවම ප්‍රමාණයේ ඝන කැපිටල් අකුරින් වෙන් වෙන්ව ලේබලය මත පහත පරිදි සඳහන් කළ යුතු යඃ-

(i) "x" අකුර වෙනුවට භාවිතා කළ යම් අනුමත පැණිරස කාරකයක නම් ආදේශ කරමින් "x" පැණිරස කාරකය අඩංගු වේ;

(ii) "වයස අවුරුදු තුනට අඩු දරුවන් සඳහා සුදුසු නොවේ".

(*ආ*) වෙළඳපොලේ ඇති නිෂ්පාදකයාගේ ඒ හා සමාන හෝ මුල් නිෂ්පාදනය සමඟ සංසන්දනය කළ විට අවම වශයෙන් සියයට 30ක (30%) ශක්තිය අඩුවීමක් තිබෙන අවස්ථාවක දී, සීනි වෙනුවට පැණි රසකාරක භාවිත කරනු ලැබිය හැකි අතර එම ලේබලය මත "ශක්තිය අඩුකළ" ප්‍රකාශය කැපිටල් අකුරින් දැක්විය හැකි ය.

(4) ආහාර නිෂ්පාදනවලට රසය වැඩි කිරීමේ කාරක එකතු කර ඇති අවස්ථාවක දී මී.මී. 1.5ක අවම ප්‍රමාණයේ කැපිටල් අකුරින් ලේබලය මත වෙන් වෙන් ව පහත ප්‍රකාශ ලියා දැක්විය යුතු ය:-

(i) එකතු කරන ලද අනුමත රසය වැඩි කිරීමේ කාරකවල නම් සහ INS අංක 'x' අකුර වෙනුවට ආදේශ කරමින්, "රසය වැඩිදියුණු කරන "x" කාරක එකතු කර ඇත"; සහ

(ii) "වයස අවුරුදු තුනට අඩු දරුවන් සඳහා සුදුසු නොවේ".

(5) එළවළු හෝ ශාකමය සම්භවයක් ඇති ආහාර නිෂ්පාදනයක, කිසියම් සත්ත්ව සම්භවයක් ඇති ද්‍රව්‍යයක් අන්තර්ගත වන්නේ නම්, එම ද්‍රව්‍යවල නම/ නම් සමඟ සත්ත්ව සම්භවයක් ඇති බවට ප්‍රකාශයක් මී.මී. 1.5 ක අවම ප්‍රමාණයේ ඝන අකුරින් ලේබලය මත පැහැදිලිව සහ කැපී පෙනෙන ආකාරයෙන් සඳහන් කළ යුතු ය. කිරි හැර කිසියම් සත්ත්ව සම්භවයක් ඇති සංඝටක එකතුකර ඇත්නම් මිස, කිරි නිෂ්පාදන සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නොවිය යුතු ය.

10. (1) අයනීකරණ විකිරණ ප්‍රතිකාරයට භාජනය කරන ලද ආහාරයක ලේබලයේ ඒ ප්‍රතිකර්මය පිළිබඳව දැක්වෙන ලිඛිත ප්‍රකාශයක් එම ආහාරයේ පොදු නාමයට ඉතා සමීපව දැක්විය යුතු ය. පහත දැක්වෙන ජාත්‍යන්තර සංකේතය කොළ පාටින් එම පොදු නාමයට ඉතා සමීපව ප්‍රකටව පෙනෙන ලෙස දැක්විය යුතු ය.

(2) ප්‍රකිරණය කරන ලද නිෂ්පාදන වෙනත් ආහාරයක ද්‍රව්‍ය ලෙස භාවිතා කරන විට, ඒ නිෂ්පාදන, මේ නියෝගයේ (1) වන ඡේදයේ සඳහන් කරන ලද ඒ ආකාරයෙන් ම ද්‍රව්‍ය ලැයිස්තුවේ වෙන් වෙන් ව ප්‍රකාශ කළ යුතු ය.

(3) එක් සංඝටකයක් සහිත නිෂ්පාදනයක් ප්‍රකිරණයට භාජනය කරන ලද යම් අමුද්‍රව්‍යයක් මගින් සකස් කරනු ලබන විට නිෂ්පාදනයේ ලේබලයේ ඒ ප්‍රතිකර්මය දක්වමින් ප්‍රකාශයක් ඇතුළත් විය යුතු ය.

11. ප්‍රධාන ආහාර බලධරයා විසින් ප්‍රදානය කරන ලද ලිඛිත අනුමතියක් මත හැර යම් ආහාරයකට අදාළව කිසිදු ලේබලයක හෝ දැන්වීමක එම ආහාරය යම් වෛද්‍ය වෘත්තිකයකු හෝ සංගමයක් හෝ යම් වෘත්තිකයකු විසින් නිර්දේශ කර ඇති බවට හැඟවෙන වචන හෝ එම ආහාරය යම් වෛද්‍ය වෘත්තිකයකු, සංගමයක් හෝ යම් වෘත්තිකයකු විසින් නිර්දේශ කර ඇති බවට, නියම කර ඇති බවට හෝ අනුමත කර ඇති බවට ඇඟවිය හැකි හෝ යෝජනා කළ හැකි වෙනත් යම් වචන හෝ උපක්‍රම හෝ පින්තූර හෝ වෙනත් ආකාරයක කිසිවක් ඇතුළත් නොකළ යුතු ය.

12. (1) යම් ආහාරයක ගැනුම්කරු හෝ පාරිභෝගිකයා නොමඟ යවන යම් ආකාරයකින් ව්‍යාජ හිමිකම් පෑමක් හෝ නොමඟ යවන සුලු විස්තරයක් එම ආහාර ද්‍රව්‍යයට අදාළ කිසිදු ලේබලයක හෝ දැන්වීමක ඇතුළත් නොකළ යුතු ය.

(2) යම් ආහාරයක අන්තර්ගතය සම්බන්ධයෙන් අසත්‍ය, නොමඟ යවන සුලු හෝ වංචනික හෝ එහි ගති ලක්ෂණ සම්බන්ධයෙන් සාවද්‍ය හැඟීමක් ඇතිවන ආකාරයෙන් කිසිදු ආහාරයක් විස්තර කිරීම හෝ ඉදිරිපත් කිරීම නොකළ යුතු ය.

(3) මේ නියෝගවල කාර්යය සඳහා "හිමිකම්පෑම" යන්නෙන්, යම් ආහාරයක සම්භවය, පෝෂණ ගුණාංග, ස්වභාවය, නිෂ්පාදනය, පිරිසැකසුම, සංයුතිය හෝ වෙනත් යම් තත්ත්වයක් සම්බන්ධයෙන් විශේෂ ගුණාංග ඇති බවට ප්‍රකාශ කරනු ලබන, අදහස් කරනු ලබන හෝ අඟවනු ලබන කුමන හෝ නියෝජනයක් අදහස් වේ.

(4) යම් ආහාරයක් සඳහා පෝෂණ හිමිකමක්, පෝෂණ පදාර්ථ අන්තර්ගත හිමිකමක්, සංසන්දනාත්මක පෝෂණ පදාර්ථ හිමිකමක් හෝ සෞඛ්‍ය හිමිකමක් ඉදිරිපත් කර ඇති විට මෙහි IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පෝෂණ ලේබලයට අනුකූලව එය සිදු කළ යුතු ය.

(5) (අ) අවසරලත් පෝෂණ පදාර්ථ අන්තර්ගත හිමිකම සහ පෝෂණ පදාර්ථ පිළිබඳ සංසන්දනාත්මක හිමිකම මෙහි V වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති නිර්දේශිත පෝෂක අගයන් ඇති (NRVs) ප්‍රෝටීන්, ආහාරමය තන්තු, විටමින් සහ ඛනිජ ලවණවලට අදාළව විය යුතු ය. පෝෂණ පදාර්ථය සඳහා වන නිර්දේශීත පෝෂක අගය (NRV) V වන උපලේඛනයේ නිශ්චිතව දක්වා නොමැති නම්, ප්‍රධාන ආහාර බලධරයාගේ පූර්ව ලිඛිත අනුමතිය ලබාගත යුතු ය.

(ආ) මෙහි VI වන සහ VII වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව ක්‍රියාකර ඇත්නම් මිස, යම් ආහාරයක කිසිදු ලේබලයකට හෝ දැන්වීමකට පෝෂණ පදාර්ථ අන්තර්ගත හිමිකමක් හෝ පෝෂණ පදාර්ථ පිළිබඳ සංසන්දනාත්මක හිමිකමක් ඇතුළත් නොකළ යුතු ය.

(ඇ) පෝෂණ පදාර්ථ අන්තර්ගත හිමිකම සහ පෝෂණ පදාර්ථ පිළිබඳ සංසන්දනාත්මක හිමිකම පිළිබඳ කොන්දේසි අදාළ කරගත හැකි අවස්ථාවලදී එම කොන්දේසි මෙහි VI වන සහ VII වන උපලේඛනවලට අනුකූලව "වැඩි", "අඩු", "අඩුකරන ලද" සහ "රහිත" මට්ටම් තීරණය කිරීමට භාවිතා කළ යුතු ය.

(ඈ) යම් පෝෂණ පදාර්ථයක සවිමත් කිරීමේ මට්ටම නිර්දේශිත පෝෂක අගයෙන් (NRV)තුනෙන් එකකට (1/3) වඩා වැඩි වී ඇත්නම් ඒ නිෂ්පාදන අලෙවි කිරීමට පෙරාතුව ප්‍රධාන ආහාර බලධරයාගේ පූර්ව ලිඛිත අනුමතිය ලබා ගත යුතු ය.

(6) (අ) සෑම සෞඛ්‍ය හිමිකමක් සහ පෝෂණ පදාර්ථ ක්‍රියාකාරිත්ව හිමිකමක් එම හිමිකම ආහාරයක ලේබලය මත ප්‍රදර්ශනය කිරීමට පෙරාතුව හෝ දැන්වීමක් පළකිරීමට පෙරාතුව හෝ ප්‍රධාන ආහාර බලධරයාගේ පූර්ව ලිඛිත අනුමතිය ඒ සඳහා ලබා ගත යුතු ය.

(ආ) V වන උපලේඛනයේ දක්වා ඇති පරිදි නිර්දේශිත පෝෂක අගයන් සඳහන් කිරීමේ සටහනේ අගයක් සඳහන් වන යම් ආහාරයක අන්තර්ගත සංඝටකයකට හිමිකම්පාන වරප්‍රසාදය ආරෝපණය කර ඇත්නම්, අදාළ ආහාරය-

(i) වැඩි කරන ලද පරිභෝජනය නිර්දේශ කර ඇති අවස්ථාවක් සම්බන්ධයෙන් සංඝටකයේ "ප්‍රභවයක්" හෝ "වැඩි" වීමක් විය යුතු ය; හෝ

(ii) "අඩු කරන ලද පරිභෝජනය නිර්දේශ කර ඇති අවස්ථාවක් සම්බන්ධයෙන් සංඝටකයේ "අඩු වීමක්" "අඩු කරන ලද" හෝ "රහිත" විය යුතු ය.

(ඇ) මෙහි V වන උපලේඛනයේ සඳහන් නිර්දේශිත පෝෂක අගයක් (NRV) සටහන් වන පෝෂණ පදාර්ථ සම්බන්ධයෙන් පමණක් පෝෂණ පදාර්ථ ක්‍රියාකාරිත්ව හිමිකමක් ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) යම් හිමිකමක් මගින් යම් ආහාරයක් ප්‍රමාණය ඉක්මවා පරිභෝජනයට උනන්දු කරවන්නේ නම් හෝ එය ක්ෂමා කරන්නේ නම් හෝ යහපත් ආහාර පිළිබඳ පුරුදු හෙළා දැකීම සිදු කරන්නේ නම් එවැනි හිමිකමක් ඉදිරිපත් නොකළ යුතු ය.

(7) යම් ආහාර ද්‍රව්‍යයකට අදාළ කිසිදු ලේබලයක ඒ ආහාර ද්‍රව්‍යය පිළිබඳ විස්තර කිරීමේ දී "පිරිසිදු" යන වචනය හෝ "පිරිසිදු" බව ඇඟවෙන වෙනත් යම් වචනයක්, ඒ ආහාර ද්‍රව්‍යය සඳහා ආහාර පනත යටතේ සාදන ලද නියෝග යටතේ වන ගතිලක්ෂණ, අගය, සංයුතිය සහ ගුණය ඇත්නම් මිස සහ කිසිදු ආකාරයක ආකලන ද්‍රව්‍ය අඩංගු නොවේ නම් මිස සඳහන් නොකළ යුතු ය.

(8) යම් ආහාරයක් විස්තර කිරීමේ දී කිසිදු ලේබලයක ''ස්වභාවික" යන වචනය-

(අ) කිසිදු ආකලන ද්‍රව්‍යයක් නොමැතිව මිශ්‍ර නොකළ, බාල නොකරන ලද හෝ පිරිසැකසුම් නොකළ නිෂ්පාදන ඒ ආහාරවල ඇතුළත්ව ඇත්නම් මිස (එසේ වුව ද, එය පැස්චරීකරණය කිරීම, පරිශ්‍රාවණය කිරීම, ශීත කිරීම හෝ අධිශීත කිරීමට භාජනය කළ හැකි ය); සහ

(ආ) ඒ ආහාරය කෘත්‍රිම ද්‍රව්‍යයන්ගෙන් තොරව ජීව විද්‍යාත්මක ද්‍රව්‍යවලින් නිපදවා ඇත්නම් මිස,

ඒ මත සඳහන් නොකළ යුතු ය.

(9) කිසියම් ආහාර ද්‍රව්‍යයක ලේබලයක එම ආහාරය විස්තර කිරීමේ දී එය ආදේශක ආහාරයක් වශයෙන් එවැනි විස්තරයක යොදාගැනීමට මෙම පනත යටතේ සාදන ලද කවර හෝ නියෝගයක් යටතේ අවසර දී ඇත්නම් මිස, එවැනි ආහාරයක් සඳහා "ආදේශක" හෝ ආදේශක බව හඟවන වෙනත් වචනයක් හෝ නොයෙදිය යුතු ය.

(10) (අ) යම් ආහාරයකට අත්‍යවශ්‍ය පෝෂණ පදාර්ථ එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එකතු කර ඇති විට එම පෝෂණ පදාර්ථ එම ආහාරයේ ස්වභාවිකවම අන්තර්ගත වුව ද, එසේ නොවූවද එසේ එකතු කිරීමෙන් අපේක්ෂා කරන ලද අරමුණ වූයේ ජනගහණය තුළ පෙනී යන එකී පෝෂණ පදාර්ථ එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක පවතින ඌනතාවක් වැලැක්වීම හෝ නිවැරදි කිරීම වන්නේ නම් මිස යම් ආහාරයකට අදාළ කිසිදු ලේබලයක හෝ දැන්වීමක එම ආහාරය සවිමත් කළ ආහාරයක් ලෙස සඳහන් නොකළ යුතු ය.

(ආ) ආහාරවලට එකතු කළ හැකි අවසරලත් විටමින්, ඛනිජලවණ, මේද අම්ල, ඇමයිනෝ අම්ල සහ නියුක්ලියෝටයිඩ ලැයිස්තුව මෙහි VIII වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇත.

(ඇ) කිසිදු පළතුරු නිෂ්පාදනයක හෝ එළවළු නිෂ්පාදනයක හෝ සීනි ආශ්‍රිත නිෂ්පාදනයක යම් ලේබලයක් මත, නිෂ්පාදනයේ ග්‍රෑම් 100ක් සඳහා ඇස්කෝබික් අම්ලය මිලිග්‍රෑම් 40ට නොඅඩු ප්‍රමාණයක් ඒ නිෂ්පාදනයේ අඩංගුව ඇත්නම් මිස ආහාර "විටමින් C මගින් සවිමත් කළ බවට" සඳහන් නොකළ යුතු ය.

(ඈ) (i) පෝෂණ පදාර්ථය එකතු කළ යුත්තේ පිරිසැකසුම් කිරීමට පසු යම් ආහාරයක පෙර පිරිසැකසුම් මට්ටමේදී පෝෂණ සැකැස්ම පවත්වාගෙන යාම සඳහා වනවිට හෝ එකතු කරන ලද පෝෂණ පදාර්ථය V වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති නිර්දේශිත පෝෂක අගයෙන් තුනෙන් එකක් (1/3) නොඉක්මවනු ලබන විට ප්‍රධාන ආහාර බලධරයාගේ අනුමතය අවශ්‍ය නොවේ.

(ii) (ඈ) (i) වන නියෝගයේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, මාස තිස් හයට (36) ට අඩු ළමුන් සඳහා ආහාර සවිමත් කිරීමේ දී ප්‍රධාන ආහාර බලධරයාගේ අවසරය ලබා ගත යුතු ය.

(ඉ) මෙහි VIII වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පෝෂණ පදාර්ථ නොවන වෙනත් යම් සවිමත් කිරීමේ ද්‍රව්‍ය හෝ වෙනත් ද්‍රව්‍ය මගින් ආහාර සවිමත් කිරීම සඳහා ප්‍රධාන ආහාර බලධරයාගේ අනුමතිය ලබාගත යුතු ය.

(ඊ) යම් ලේබලයක හෝ දැන්වීමක සමාන ගුණාංග ඇති සමාන ආහාර සම්බන්ධයෙන් හිමිකම්පෑමක් හෝ ප්‍රකාශයක් කරනු ලැබ ඇති අවස්ථාවක නියම කරනු ලබන භාෂාවෙන් හා සමාන අකුරු වර්ගයෙන් ම මුල් ප්‍රකාශයට ආසන්නවම එම ලේබලයේ හෝ දැන්වීමේ සමාන ආහාරයන්ගේ සමාන ගුණාංග තිබෙන බවට තවත් හිමිකම්පෑමක් හෝ ප්‍රකාශයක් කළ යුතු ය.

උදා:- එළවළු තෙල් අඩංගු බහාලුවක ලේබලයක ඒ තෙල් කොලොස්ටරෝල් නොමැති බව සඳහන් වන්නේ නම්, එම භාෂාවෙන් හා අකුරු වර්ගයෙන් ම එකී මුල් ප්‍රකාශයට ආසන්නව එළවළු තෙල්වල කොලොස්ටරෝල් අඩංගු නොවන බවට ලේබලය මත තවත් ප්‍රකාශයක් සිදු කළ යුතු ය.

(11) (අ) යම් ආහාරයකට අදාළව, යම් විශේෂ ආහාර අවශ්‍යතාවක් පිළිබඳ අදහස් කරමින් ප්‍රකාශයක් හෝ ඉල්ලීමක් ඒ ආහාරයට අදාළ ලේබලයේ හෝ දැන්වීමේ ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, ඒ ලේබලයේ ඒ ආහාරය නිර්දේශ කර ඇත්තේ කවර අවශ්‍යතාවයකට අනුවද යන්න සඳහන් කරන ප්‍රකාශයක් තිබිය යුතු ය.

(ආ) යම් ආහාරයකට අදාළ කිසිදු ලේබලයක හෝ දැන්වීමක ඒ ආහාරය ශක්තිජනක ප්‍රභවයක් බවට ඍජුව හෝ වක්‍රව ප්‍රකාශ නොකළ යුතු ය:

එසේ වුව ද, ඒ ආහාරය ශක්ති ජනක ප්‍රභවයක් බවට හිමිකම්පෑමක දී, ඒ ආහාරයේ ග්‍රෑම් 100ක (හෝ මී.ලි. 100ක) ශක්ති අගය කිලෝ කැලරි 100ක් (425 KJ) හෝ ඊට වැඩියෙන් අඩංගු විය යුතු අතර ඊට අමතරව පහත දැක්වෙන ප්‍රකාශ සඳහන් කළ යුතු ය.

(අ) ග්‍රෑම් 100ට (හෝ මී.ලි. 100) ශක්ති අගය kcals හෝ kJ වලින් සහ සුදුසු අවස්ථාවල දී ආහාරයක පිළිගන්වන ප්‍රමාණය අනුව; සහ

(ආ) එක් එක් ග්‍රෑම් 100ක් (හෝ මී.ලි. 100)ක අඩංගු කාබෝහයිඩ්‍රේට්, ප්‍රෝටීන් සහ මේදය ප්‍රමාණය සහ සුදුසු අවස්ථාවක දී ආහාරයක පිළිගන්වන ප්‍රමාණය අනුව.

(12) (අ) යම් ආහාරයකට අදාළ කිසිදු ලේබලයක හෝ දැන්වීමක ආහාරමය මේදයන් හදවත් රෝගවලට එරෙහි ආරක්ෂණයක් බවට හෝ හදවත් රෝගවලින් පෙලෙන තැනැත්තන්ට එය ප්‍රයෝජනවත් වන බවට ප්‍රකාශ නොකළ යුතු ය.

(ආ) යම් ආහාරයකට අදාළ කිසිදු ලේබලයක හෝ දැන්වීමක ප්‍රධාන ආහාර බලධරයාගේ පූර්ව අනුමතය ලබා ඇත්නම් මිස අබලතාවන් සඳහා හිතකර හෝ යම් අසනීප සුව කරන, සහනය ලබාදෙන හෝ වළක්වනු ලබන හෝ නැවත යථා තත්ත්වයට පත් කිරීමේ හෝ ඖෂධීය ගුණයක් හෝ ගුණාංග එම ආහාරයේ ඇතුළත් වන බවට ඍජුව හෝ වක්‍රව සඳහන් කිරීම නොකළ යුතු ය.

(ඇ) යම් ආහාරයකට අදාල කිසිදු ලේබලයක හෝ දැන්වීමක ඒ ආහාරය යම් රෝගයක් සුව කරන බවට ඍජුව හෝ වක්‍රව ප්‍රකාශයක් නොකළ යුතු ය.

(ඈ) ප්‍රධාන ආහාර බලධරයාගේ පූර්ව අනුමතිය ලබා ඇත්නම් මිස යම් ආහාරයකට අදාළ කිසිදු ලේබලයක හෝ දැන්වීමක ඒ ආහාරය ශරීරය කෘශ කිරීමට, ශරීරයේ බර වැඩි කිරීමට, බර පාලනය කිරීමට හෝ බර අඩු කිරීමට උපකාරී වන බවට වන හිමිකම්පෑමක් සඳහන් නොකළ යුතු ය.

(ඉ) ප්‍රධාන ආහාර බලධරයා විසින් අන්‍යාකාරයෙන් අවසර ලබා දී ඇත්නම් හෝ යම් නියෝගවලට අනුකූලව මිස මෙම නියෝගයේ අවසර ලබා දී ඇති ආහාර නිෂ්පාදනයේ වර්ග නාමය හෝ වෙළඳ නාමය හැරුණු විට ආහාරයේ පෝෂණ පදාර්ථ, ජීව ක්‍රියාකාරී සංඝටක හෝ ද්‍රව්‍ය එහි පොදු නාමයෙන් හෝ ඝන නාමයෙන් හැර වචන, සංකේත, ලාංඡන හෝ පින්තූර මගින් තනි හෝ සාමූහික වෙළඳ ලකුණක් වශයෙන් ලේබලයේ හෝ දැන්වීම්වල නියෝජනය නොවිය යුතු ය.

(13) යම් ආහාරයක් සකස් කිරීමේ දී නිසි ක්‍රියාවලි සහ පරිචයන් පිළිපදිනු ලැබ ඇත්නම් සහ යම් ප්‍රතීතන ආයතනයකින් හෝ නිසි බලධරයකුගෙන් ඒ සඳහා වලංගු සහතිකයක් ලබාගෙන ඇත්නම් මිස කිසිදු තැනැත්තකු විසින් යම් ආහාරයක් "කාබනික" ලෙස ලේබල් නොකළ යුතු ය.

13.(1) ප්‍රධාන ආහාර බලධරයාගේ පූර්ව ලිඛිත අනුමතිය නොමැතිව කිසිදු තැනැත්තකු විසින්, යම් ආහාරයකට අදාළ යම් සෞඛ්‍ය හිමිකමක් හෝ පෝෂණ පදාර්ථ ක්‍රියාකාරීත්ව හිමිකමක් ඇතුළත් කිසිදු දැන්වීමක් ප්‍රචාරණය නොකළ යුතු ය. "අනුමතිය ලබා දෙනු ලබන ලිපියේ" සඳහන් කර ඇති යොමු අංකය දැන්වීම සමග ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(2) 13.(1) වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති නිෂ්පාදනවලින් එක් නිෂ්පාදනයකට වඩා ප්‍රචාරණය කිරීමට අපේක්ෂා කරනු ලබන යම් තැනැත්තකු විසින් ඒ එක් එක් ආහාරය සම්බන්ධයෙන් වෙන වෙනම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

(3) යම් ආහාරයක් ප්‍රචාරණය කිරීම සඳහා වූ සෑම ඉල්ලුම්කරුවකුම ඔහුගේ ඉල්ලීම සමඟ ප්‍රධාන ආහාර බලධරයා වෙත මෙහි IX වන උපලේඛනයේ අ ආකෘතියේ නිශ්චිතව දක්වා ඇති පරිදි නියම කරනු ලැබිය හැකි සියලු තොරතුරු සහ ප්‍රධාන ආහාර බලධරයා විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි වැඩිදුරටත් වූ යම් තොරතුරු ප්‍රධාන ආහාර බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) සෑම ඉල්ලුම්පත්‍රයක් ම පහත දැක්වෙන ලේඛන සහ ශ්‍රව්‍ය දෘෂ්‍ය උපාංග ඇත්නම් ඒවා සමඟ ඉදිරිපත් කළ යුතු යः

(i) ප්‍රචාරණ දැන්වීමේ කෙටුම්පතක්;

(ii) එය ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් සිදුකර ඇත්නම් සිතුවම් පෙළෙහි පිටපතක්;

(iii) යම් ආහාර අයිතමයක හිමිකමකට අදාළ යම් අනුමතියක් කලින් ප්‍රධාන ආහාර බලධරයා විසින් ලබා දී ඇත්නම්, ඒ අනුමතිය පිළිබඳ තොරතුරු;

(iv) වෙනත් අදාළ ලේඛන; සහ

(v) ගාස්තු ගෙවන ලද රිසිට් පතේ මුල් පිටපත.

(5) "අනුමතිය ලබා දීමේ ලිපියක්" සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු මෙහි IX වන උපලේඛනයේ ඇ ඇමුණුමේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(6) යම් ආහාරයක් ප්‍රචාරණය සඳහා "අනුමතිය ලබා දීමේ ලිපියක්" සඳහා ඉල්ලීමක් ලැබුණු පසුව, ප්‍රධාන ආහාර බලධරයා විසින් මෙම කාර්ය සඳහා ආහාර උපදේශක කමිටුව විසින් පත් කරන ලද අනු කමිටුව වෙත ඒ ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය. මේ කමිටුවේ සභාපතිවරයා ආහාර පාලන පරිපාලනය භාර අධ්‍යක්ෂවරයා විය යුතු ය.

(7) ඒ ඉල්ලීම ලැබීමෙන් පසු මාස දෙකක කාලසීමාවක් තුළ අනු කමිටුව විසින් එහි නිර්දේශයන් ඉදිරිපත් කළ යුතු ය. අනුකමිටුව විසින් අමතර තොරතුරු අපේක්ෂා කරනු ලබන විට මෙම කාලසීමාව අදාළ නොවිය යුතු ය.

(8) ප්‍රධාන ආහාර බලධරයා විසින් මෙහි IX වන උපලේඛනයේ ආ ආකෘතියේ නිශ්චිතව දක්වා ඇති "අනුමතිය ලබා දීමේ ලිපිය" ප්‍රදනය කරනු ලැබිය හැකි ය.

(9) අනුමතිය ප්‍රදානය කළ නිෂ්පාදනයේ පෝෂණ පදාර්ථ සංයුතියේ යම් වෙනසක් හෝ අනුමත කළ දැන්වීමේ අන්තර්ගතය හෝ ආකෘතිය වෙනස් කර ඇතිවිට හෝ එහි නියම කර ඇති යම් කොන්දේසි උල්ලංඝනය කරනු ලැබ ඇත්නම් "අනුමතිය ලබා දීමේ ලිපිය" ශුන්‍ය සහ බලරහිත විය යුතු ය. යම් උල්ලංඝනය කිරීමක් පවතින්නේ නම් ප්‍රචාරණය අත්හිටුවීමට අනුමතිය ලබා දීමේ ලිපිය දරන්නාට සහ මාධ්‍යයට හෝ ප්‍රචාරණ නියෝජ්‍යායතනයට හෝ නියෝජිතයාට හෝ ආයතනයට ප්‍රධාන ආහාර බලධරයා විසින් දැනුම් දෙනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, යම් නඩු පැවරීමක් සඳහා මෙය බාධකයක් නොවිය යුතු ය.

(10) "අනුමතිය ලබා දීමේ ලිපිය" එය කලින් ප්‍රත්‍යාදිෂ්ඨ කර හෝ අවලංගු කර ඇත්නම් මිස වසර තුනක (3) කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය.

(11) ඒ අනුමතිය අලුත් කිරීම සඳහා වූ යම් ඉල්ලීමක් වලංගු කාලසීමාව ඉකුත්වීමට මාස හයකට (6) පෙරාතුව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(12) අනුමතිය අලුත් කිරීම සඳහා වූ යම් ඉල්ලුම්පත්‍රයක් මෙහි IX වන උපලේඛනයේ ඇ ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(13) අනුමත කරන ලද දැන්වීම හෝ හිමිකම්පෑම ප්‍රතිශෝධනය කිරීමට නව විද්‍යාත්මක සාක්ෂි මත පදනම්ව ප්‍රධාන ආහාර බලධරයා වෙත යම් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇතිවිට, ආහාර උපදේශක කමිටුවේ එකඟත්වය ඇතිව ප්‍රධාන ආහාර බලධරයා විසින් අනුකමිටුව වෙත එය සමාලෝචනය කර වාර්තා කරන ලෙසට විධාන කළ හැකි ය.

(14) කිසිදු ප්‍රචාරණ නියෝජ්‍යායතනයක්, අනුයෝජිතයකු හෝ (මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික, බාහිර) වශයෙන් වූ යම් මාධ්‍ය ආයතනයක් විසින් ආහාරවල සෞඛ්‍ය හිමිකමක් හෝ පෝෂණ පදාර්ථ ක්‍රියාකාරීත්ව හිමිකමක් ඇතුළත් කිසිදු දැන්වීමක් ප්‍රධාන ආහාර බලධරයා විසින් නිකුත් කළ අනුමතිය ලබා දීමේ ලිපියක් නොමැතිව භාර නොගත යුතු ය.

(15) අලුත් කිරීම සඳහා වූ ඉල්ලීමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු මෙහි IX වන උපලේඛනයේ ඇ ඇමුණුමේ නිශ්චිතව දැක්වේ.

(16) කිසිදු තැනැත්තකු විසින් ළඳරු ආහාර වට්ටෝරු (ආරම්භක), ළඳරු ආහාර වට්ටෝරු (පසුව ලබාදෙනු ලබන), ළදරුවන් සඳහා දෙනු ලබන වෙනත් යම් ආහාර නිෂ්පාදන හෝ ළමයින් සඳහා වන කිරි සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ ප්‍රචාරණයන් සිදු නොකළ යුතු ය.

(17) ආහාර සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍රව ගැබිණි මවක් හෝ කිරිදෙන මවක්, ළදරුවෙක් හෝ වයස අවුරුදු දොළහ (12)ට අඩු ළමයකු නියෝජනය වන ශ්‍රව්‍ය දෘෂ්‍ය හෝ පින්තූර සහිත යම් ප්‍රචාරණ දැන්වීමක් කිසිදු තැනැත්තකු විසින් යම් නිෂ්පාදනයක ලේබලයක, මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික, සමාජ මාධ්‍යයෙන් හෝ වෙනත් යම් ආකාරයකින් ප්‍රචාරණය නොකළ යුතු ය.

(18) ප්‍රධාන ආහාර බලධරයා විසින් අනුමත කර ඇත්නම් මිස කිසිදු තැනැත්තකු විසින් සෘජුව හෝ වක්‍රව වයස අවුරුදු දොළහ (12)ට අඩු ළමයින් වෙත යම් ආහාර අයිතම සමඟ හෝ වෙනම පත්‍රිකා, නොමිලේ ලබාදෙන සාම්පල, ද්‍රව්‍ය හෝ සෙල්ලම් බඩු ආකාරයෙන් හෝ කාටූන් චරිත, වාසනාව ගෙනදෙන බවට සැලකෙන යම් වස්තුවක් හෝ ප්‍රසිද්ධ පුද්ගලයන් යොදාගනිමින් හෝ වෙනත් යම් ආකාරයකින් යම් ආහාරයක් ප්‍රවර්ධනය කිරීම සිදු නොකළ යුතු ය.

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම නියෝගවල-

"සම්මිශ්‍රණය කිරීම" යන්නෙන්, වෙනස් සංඝටක මිශ්‍රණයකට භෞතිකව මිශ්‍ර කරමින් සාදන ලද නිෂ්පාදනයක් අදහස් වේ;

"ප්‍රචාරණ දැන්වීම" යන්නට, පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය;

"අනුමත කළ ප්‍රචාරණ දැන්වීම" යන්නෙන්, ප්‍රධාන ආහාර බලධරයා විසින් නිසි ලෙස අනුමත කළ ප්‍රචාරණ දැන්වීමක් අදහස් වේ;

"ජීව ක්‍රියාකාරී සංඝටක" යන්නෙන්, ආහාර දාමයක කොටස් ලෙස පවතින සහ මානව සෞඛ්‍යයට හිතකර බලපෑමක් ඇති බවට පෙන්විය හැකි ස්වභාවයෙන් ම පවතින අත්‍යාවශ්‍ය සහ අත්‍යාවශ්‍ය නොවන සංඝටක අදහස් වේ;

"ප්‍රධාන ආහාර බලධරයා" යන්නට, පනතේ ඇති එම අර්ථයම තිබිය යුතු ය;

ආහාරයක "පොදු නාමය" යන්නෙන්, පොදුවේ ආහාර හඳුනා ගන්නේ යම් නාමයක් යටතේ ද ඒ නාමය අදහස් වේ;

"ආහාරමය තන්තු" යන්නෙන්, පහත දැක්වෙන කාණ්ඩවලට අයත් මනුෂ්‍යයන්ගේ කුඩා බඩවැල් තුළ දී අභ්‍යන්තරයේ හටගත් එන්සයිම මගින් ජලවිච්ඡේදනය නොවන්නා වූ මොනොමෙරික් (ඒක අවයව) ඒකක දහයක් (10) හෝ ඊට වැඩියෙන් වූ කාබෝහයිඩ්‍රේට් පොලිමර් (බහු අවයව) අදහස් වේ;

- පරිභෝජනය කරනු ලබන විට ආහාරවල ස්වාභාවිකව ම පවතින කෑමට යෝග්‍ය කාබෝහයිඩ්‍රේට් පොලිමර් (බහු අවයව);
- භෞතික, එන්සයිම හෝ රසායනික ආකාරයෙන් ආහාර අමුද්‍රව්‍යවලින් ලබාගෙන ඇති සහ නිසි බලධාරීන් වෙත පොදුවේ පිළිගත හැකි විද්‍යාත්මක සාක්ෂි වලින් පෙන්නුම් කරන පරිදි සෞඛ්‍යයට කායික විද්‍යාත්මකව හිතකර බලපෑමක් ඇති බවට පෙන්නුම් කරනු ලැබ ඇති කාබෝහයිඩ්‍රේට් පොලිමර් (බහු අවයව);
- නිසි බලධාරීන් වෙත පොදුවේ පිළිගත හැකි විද්‍යාත්මක සාක්ෂිවලින් පෙන්නුම් කරන පරිදි සෞඛ්‍යයට කායික විද්‍යාත්මකව හිතකර බලපෑමක් ඇති බවට පෙන්නුම් කරනු ලැබ ඇති කෘත්‍රිම (සින්තටික්) කාබෝහයිඩ්‍රේට් පොලිමර් (බහු අවයව);

"පිටි සහිත රසකැවිලි" යන්නෙන්, ධාන්‍ය මිශ්‍රණයක් සහ වෙනත් ආහාර ද්‍රව්‍ය ඇතුළත් කරමින් පිසින ලද හෝ නොපිසින ලද පේස්ට්‍රි, කේක් සහ බිස්කට් ඇතුළත් නිෂ්පාදන අදහස් වන අතර, වෙනත් අනුමත කරන ලද පිටි එකතු කිරීමෙන් සාදන ලද පාන් සහ පාන්වර්ග මෙයින් බැහැර කෙරේ;

"අකුරුවල ප්‍රමාණය" යන්නෙන් -

(i) ඉංග්‍රීසි කැපිටල් අකුරු (ලොකු අකුරු) සම්බන්ධයෙන් වන විට දී අකුරුවල උස; හෝ

(ii) සිම්පල් අකුරු සම්බන්ධයෙන් වන විට දී ආරෝහණ හෝ අවරෝහණ පිළිවෙළක් නොමැති අකුරුවල (උදා:- a, n, m, ග, ස, ප, ய, ட, ஏ) උස,

අදහස් වේ;

"වට්ටෝරු ගත කැෆේන් අඩංගු පානයන්" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර 183:2018 හි කාබනිකෘත බීම වර්ග (3 වන සංශෝධනය) සඳහා දක්වා ඇති අර්ථය තිබිය යුතු ය;

"සවිමත් කිරීමේ ද්‍රව්‍ය" යන්නෙන්, ආහාරයක පෝෂණ පදාර්ථ අගය වැඩි කිරීමට ආහාරයකට රසායනිකව හෝ ස්වභාවික ආකාරයකින් එකතු කළ ද්‍රව්‍යයක් අදහස් වේ;

"සෞඛ්‍ය හිමිකම්පෑමක්" යන්නෙන්, ආහාරයක් හෝ ඒ ආහාරයේ සංඝටකයක් සහ සෞඛ්‍යය අතර යම් සම්බන්ධතාවයක් පවතින බවට ප්‍රකාශ කරන, යෝජනා කරන හෝ හඟවන යම් නියෝජනයක් අදහස් වේ. සෞඛ්‍යය හිමිකම්පෑමකට පහත දැක්වෙන දේ ඇතුළත් වේ:-

(i) පෝෂණ පදාර්ථ ක්‍රියාකාරිත්ව හිමිකම්පෑම - ශරීරය වර්ධනයේ දී, සංවර්ධනයේ දී සහ සාමාන්‍ය ක්‍රියාකාරීත්වයේ දී පෝෂණ පදාර්ථයේ කායික විද්‍යාත්මක කාර්යභාරය විස්තර කරනු ලබන පෝෂණ හිමිකම්පෑමක් උදා: "ශක්තිමත් අස්ථි සහ දත් වර්ධනයට කැල්සියම් උපකාරී වේ. x ආහාරය කැල්සියම් මූලාශ්‍රයක්/කැල්සියම් ඉහළ ප්‍රමාණයක් පවතී."

(ii) අනෙකුත් ක්‍රියාකාරීත්ව හිමිකම්පෑම් - ශරීරයේ සාමාන්‍ය ක්‍රියාකාරීත්වයේ දී හෝ ජීව විද්‍යාත්මක ක්‍රියාකාරකම්වල දී පූර්ණ ආහාරයක් සම්බන්ධයෙන් ආහාර හෝ ඒවායේ සංඝටක පරිභෝජනය කිරීමේ විශේෂිත හිතකර බලපෑම් සම්බන්ධයෙන් මෙම හිමිකම් අදාළ වේ. ඒ හිමිකම්පෑම් සෞඛ්‍යය පිළිබඳ සාධනීය දායකත්වයට හෝ ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීමට හෝ සෞඛ්‍යය වෙනස් කිරීමට හෝ ආරක්ෂා කිරීමට අදාළ වේ. උදා: A නැමැති ද්‍රව්‍ය (සෞඛ්‍ය ආශ්‍රිත කායික විද්‍යාත්මක ක්‍රියාකාරීත්වය හෝ ජීවවිද්‍යාත්මක කටයුතු වැඩිදියුණු කිරීම හෝ වෙනස් කිරීමේ දී A ද්‍රව්‍යයේ බලපෑම නම් කිරීම). Y නැමැති ආහාරයේ A නැමැති ද්‍රව්‍යයෙන් ග්‍රෑම් X අඩංගු වේ.

"ළදරුවන්" යන්නෙන්, මාස දොළහට අඩු තැනැත්තන් අදහස් වේ;

"සංඝටකය" යන්නෙන්, යම් ආහාරයක් නිෂ්පාදනයේ දී හෝ සකස් කිරීමේ දී භාවිතා කරනු ලබන සහ බොහෝ දුරට වෙනස් වූ ආකාරයකින් වුවත් අවසාන නිෂ්පාදනයේ පවතින යම් ආහාර ආකළන ද්‍රව්‍යයක් ඇතුළු ඕනෑම ද්‍රව්‍යයක් අදහස් වේ;

"ලේබල් කිරීම" යන්නට, පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ප්‍රධාන රාමුව" යන්නෙන්, සිල්ලර වෙළඳාම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන චාරිත්‍රානුකූල කොන්දේසි යටතේ බොහෝදුරට ප්‍රදර්ශනය කළ හැකි, ඉදිරිපත් කළ හැකි, පෙන්නුම් කළ හැකි හෝ පරීක්ෂා කළ හැකි යම් ලේබලයක කොටස අදහස් වේ:

එසේ වුව ද, "ප්‍රධාන රාමුව" ලෙස සැලකිය යුතු ප්‍රදේශය ඇසුරුමේ හෝ බහාලුවේ පතුල හැර සම්පූර්ණ මතුපිට ප්‍රදේශයෙන් සියයට විස්සකට වඩා නොඅඩු විය යුතු ය;

"පෝෂණ හිමිකම්පෑම" යන්නෙන්, විටමින් සහ ඛනිජ ලවණ අන්තර්ගත වන ලෙස ම ආහාරයක ශක්ති අගය සහ ප්‍රෝටීන්, මේද සහ කාබෝහයිඩ්‍රේට් අන්තර්ගතයන්ට සීමා නොවන නමුත් ඒවා ඇතුළත්ව යම් ආහාරයකට විශේෂිත

පෝෂණ ගුණයක් ඇති බවට ප්‍රකාශ කරනු ලබන, යෝජනා කරනු ලබන හෝ හඟවනු ලබන යම් ඉදිරිපත් කිරීමක් අදහස් වේ;

පෝෂණ හිමිකම්පෑම්වලට පහත දැක්වෙන දෑ අඩංගු නොවිය යුතු ය:

(අ) සංඝටක ලැයිස්තුවේ ද්‍රව්‍යයන් සඳහන් කිරීම;
(ආ) පෝෂණ ලේබලයේ අනිවාර්ය කොටසක් ලෙස පෝෂණ පදාර්ථයන් සඳහන් කිරීම;
(ඇ) ආහාර පනත මගින් සහ ඒ පනත යටතේ සාදන ලද එහි නියෝග මගින් නියම කර ඇතිවිට ලේබලය මත ඇතැම් පෝෂණ පදාර්ථයන් හෝ සංඝටක ප්‍රමාණාත්මකව හෝ ගුණාත්මකව ප්‍රකාශ කිරීම.

"පෝෂණ පදාර්ථය" යන්නෙන්,

(අ) ශක්තිය සපයන;
(ආ) වර්ධනය, සංවර්ධනය සහ ජීවිතය පවත්වාගෙන යාමට අවශ්‍ය වන්නා වූ; හෝ
(ඇ) ඌනතාවක් ඇති වූ විට නෛසර්ගික ජෛව රසායනික හෝ කායික විද්‍යාත්මක වෙනස්කම් ඇතිවීමට බලපෑ හැකි,

යම් ආහාරයක සංඝටකයක් වශයෙන් සාමාන්‍යයෙන් පරිභෝජනය කරනු ලබන යම් ද්‍රව්‍යයක් අදහස් වේ.

"පෝෂණ පදාර්ථ අන්තර්ගත හිමිකම්පෑම" යන්නෙන්, යම් ආහාරයක අඩංගු යම් පෝෂණ පදාර්ථ මට්ටම (උදා:-"කැල්සියම් මූලාශ්‍රය (ප්‍රභවය)", "තන්තු වැඩි" සහ "මේදය අඩු") විස්තර කරනු ලබන පෝෂණ හිමිකම්පෑමකි;

''පෝෂණ පදාර්ථයන් පිළිබඳ සංසන්දනාත්මක හිමිකම්පෑම" යන්නෙන්, ආහාර දෙකක හෝ ඊට වැඩි ගණනක පෝෂණ පදාර්ථ මට්ටම් සහ/හෝ ශක්ති අගය (උදා:- "අඩු", "නොඅඩු", "සුළු", "සැහැල්ලු", "වැඩිකල," "වඩාත් වැඩි)" සංසන්දනය කරනු ලබන හිමිකම්පෑමක් අදහස් වේ;

"පෝෂණ ලේබලය" යන්නෙන්,

(අ) පෝෂණ පදාර්ථ ප්‍රකාශයක්; සහ
(ආ) අතිරේක-පෝෂණ පදාර්ථ පිළිබඳ තොරතුරු

යන අංග දෙකකින් සමන්විත යම් ආහාරයක පෝෂණීය ගුණාංග පාරිභෝගිකයා වෙත දැනුම් දීමට අදහස් කරනු ලබන විස්තරයක් වේ;

"පෝෂණ පදාර්ථ ප්‍රකාශය" යන්නෙන්, යම් ආහාරයක අන්තර්ගත පෝෂණ පදාර්ථ පිළිබඳ ප්‍රමිතිගත කරන ලද ප්‍රකාශයක් හෝ ලැයිස්තුගත කිරීමක් අදහස් වේ;

"නිර්දේශිත පෝෂක අගයන් (NRVs)" යන්නෙන්, පෝෂණ ලේබල සහ අදාළ හිමිකම්පෑම්වල කාර්යයන් සඳහා විද්‍යාත්මක දත්ත මත පදනම් වූ සංඛ්‍යාත්මක අගයන් සහිත වූ කාණ්ඩයක් වේ. ඒවා පහත දැක්වෙන නිර්දේශිත පෝෂක අගයන් පිළිබඳ (NRV) ආකාර දෙකකින් සමන්විත වේ:-

(අ) නිර්දේශිත පෝෂක අගයන්-පිළිබඳ අවශ්‍යතාවන් (NRVs-R) මගින් පෝෂණ පදාර්ථ අවශ්‍යතාවයන්, පෝෂණ පදාර්ථ මට්ටම මත පදනම් වී තිබෙන නිර්දේශිත පෝෂක අගයන් පිළිබඳව සඳහන් කරනු ලබයි;

(ආ) නිර්දේශිත පෝෂක අගයන් - බෝ නොවන රෝග (NRVs - NCD) මගින් පෝෂණ පදාර්ථ ඌනතාවක් හේතුවෙන් ඇතිවන රෝග හෝ ආබාධ ඇතුළත් නොවන ආහාර ක්‍රමය මත පදනම් වූ බෝ නොවන රෝග පිළිබඳ අවධානම අඩු කිරීම හා ආශ්‍රිත පෝෂණ පදාර්ථ මට්ටම මත පදනම් වූ NRV අදහස් වේ.

"සිල්ලර වෙළඳාම සඳහා වූ ඇසුරුම්" යන්නෙන්, ගැනුම්කරු ඉදිරිපිට දී ලබාගත යුතු, ගණනය කළ යුතු, බර කිරා බැලිය යුතු හෝ මැනිය යුතු සහ විකිණිය යුතු යම් නිශ්චිත ආහාර අයිතමයන් ඇතුළත් සිල්ලර වෙළඳාම සඳහා අරමුණු

කරන ලද ඇසුරුමක් හෝ බහාලුවක් අදහස් වන අතර මෙම නියෝගවලට අනුකූලව ලේබල් කළ, අලෙවියට පෙර ඇසුරුම්කළ සිල්ලර ඇසුරුම් ඇතුළත් වන්නා වූ බහාලුවක් ඇතුළත් නොවේ;

"තැනැත්තා" යන්නට, සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

"අලෙවියට පෙර ඇසුරුම් කළ" යන්නෙන්, පාරිභෝගිකයාට ඉදිරිපත් කිරීමට හෝ ආහාර පාන සැපයීමේ කාර්ය සඳහා සූදානම් කිරීමට පෙර යම් බහාලුවක ඇසුරුම් කිරීම හෝ සැකසුම් කිරීම අදහස් වේ;

"පිරිසැකසුම් ආධාරක ද්‍රව්‍යය" යන්නෙන්, අමුද්‍රව්‍යය හෝ ආහාර හෝ ඒවායේ සංඝටකවලට සිතාමතාම යොදා ගන්නා, භාජන හෝ උපකරණ ඇතුළත් නොවන, ආහාර සංඝටකයක් ලෙස පරිභෝජනය නොකරන, ආහාරයකට ප්‍රතිකාර කරන හෝ පිරිසැකසුම් කරන අතරතුර යම් තාක්ෂණික අරමුණක් ඉටුකිරීම සඳහා එහෙත් සිතාමතාම (ඇති) නොකරන නමුත් නොවැළැක්විය හැකි ලෙස ආහාරයක අවසාන නිෂ්පාදනයේ අවශේෂ හෝ ව්‍යුත්පන්න ඇතිකිරීමට ඉඩකඩ තිබෙන කිසියම් ද්‍රව්‍යයක් හෝ දෙයක් අදහස් වේ.

"බහු අසංතෘප්ත මේද අම්ල" යන්නෙන්, බැඳීම් දෙකක් මගින් බිඳී ගිය cis-cis මෙතිලීන් සමගින් වූ මේද අම්ල අදහස් වේ;

"සීනි" යන්නෙන්, ආහාරවල පවතින සියලු මොනෝ සැකරයිඩ් සහ ඩයි සැකරයිඩ් අදහස් වේ;

"සීනි රසකැවිලි" යනු, කෑමට ගත හැකි මේද, කිරි නිෂ්පාදන, ජෙලටින්, කෑමට ගතහැකි මැලියම් (ගම්), ඇටවර්ග හෝ කල් තබා ගතහැකි සේ සකස්කළ පළතුරු එක් කිරීම සහිතව හෝ රහිතව රසකළ ලැකරයිස් සහ චූවින්ගම් ද ඇතුළත්ව සීනි ප්‍රධාන ද්‍රව්‍ය වශයෙන් සැලකෙන තවදුරටත් සකස් කිරීමකින් හෝ පිරිසැකසුම් කිරීමකින් තොරව පරිභෝජනයට සුදුසු ඝන හෝ අර්ධ වශයෙන් ඝන සම්පූර්ණ ආහාරයකි. එහෙත් මෙයට චොකලට්, රසකැවිලි, අයිස්ක්‍රීම් වර්ග, අයිස් ලොලිස්, ටේබල් ජෙලීස්, ටේබල් ජෙලි සැකසුම්, ස්ලැබ්, මාසිපන්, මෙරින්ගස් හෝ ඖෂධ නිෂ්පාදන හෝ සීනි ඇතුළත් නොවේ;

"භාෂා තුන" යන්නෙන්, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා අදහස් වේ;

"ට්‍රාන්ස් මේද අම්ල" යන්නෙන්, ඇඳුනු ව්‍යූහයක දී ද්විත්ව බැඳීමක් පවතින අවම වශයෙන් එක් මෙතිලීන් කාණ්ඩයකින්, කාබන්-කාබන්වලින් අබන්ධතාවය බිඳින ලද ප්‍රතිබද්ධවීමක් නොදරන ඒක අසංතෘප්ත සහ බහු අසංතෘප්ත මේද අම්ලවල සියලු ජ්‍යාමිතික සමාවයවිකයන් අදහස් වේ;

"තොග ඇසුරුම්" යන්නෙන්,

(අ) පළමුව සඳහන් කළ ඇසුරුම අතරමැදියකුට විකිණීම, බෙදාහැරීම හෝ භාරදීම සඳහා අරමුණු කරන සහ එක් පාරිභෝගිකයකුට කෙලින් ම විකිණීම සඳහා අරමුණු නොකරන අවස්ථාවක දී සිල්ලර ඇසුරුම් සංඛ්‍යාවක් ඇතුළත් වන; හෝ

(ආ) කුඩා ප්‍රමාණවලින් පාරිභෝගිකයකුට යම් ආහාර වෙළඳ භාණ්ඩ විකිණීමට, බෙදාහැරීමට හෝ භාරදීමට යම් අතරමැදියකුට හැකියාව ලබාදීමට තොග වශයෙන් ඒ අතරමැදියාට විකුණන ලද ආහාර වෙළඳභාණ්ඩයක් ඇතුළත් වන

ඇසුරුමක් අදහස් වේ;

"කුඩා දරුවා" යන්නෙන්, වයස මාස දොළහක් සහ මාස තිස්හයක් අතර තැනැත්තකු අදහස් වේ.

15. 2005 ජනවාරි මස 19 වන දින අංක 1376/9 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1980 අංක 26 දරන ආහාර පනත යටතේ සාදන ලද 2005 ආහාර (ලේබල් කිරීමේ සහ ප්‍රචාරය කිරීමේ) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

## I වන උපලේඛනය

4(1)(අ) වන නියෝගය

(අ) බිස්කට් :

චීස් බිට්ස්, ක්‍රීම් ක්‍රැකර්, බ්‍රැන් ක්‍රැකර්, කුරක්කන් ක්‍රැකර්, ක්‍රිස්කෝ, ලෙමන් පෆ්, මාරි, ජින්ජර් නට්ස්, නයිස්, වේෆස්, කුකීස්, ඩයිජෙස්ටිව් බිස්කට්

(ආ) මස් නිෂ්පාදන :

බ්‍රැට්වර්ස්ට්, පැස්ටා මෝටඩෙල්ලා, පෝකීස්, සලාමි, ලිංගුස්, චිපොලොටස්, බොක්වර්ස්ට්, ෆ්‍රැන්ක්ෆර්ටස්, වයිට්වර්ස්, ලන්චියන් මීට්, පේට්, මීට් ලෝෆ්, මීට් බෝල්ස්, චිකන් රෝල්ස්

(ඇ) ඇඹුල්තියල්

(ඈ) කාබනීකෘත බීම වර්ග

(ඉ) රසකැවිලිः චොකෝ

වට්ටෝරුගත කැෆේන් සහිත බීම වර්ග හැර කාබනීකෘත සියලු බීම වර්ග, පොදු නාමය භාවිත කිරීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

## II වන උපලේඛනය

5(ඇ) වන නියෝගය

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *අවම උස* | *ලේබලයේ ප්‍රධාන රාමුවේ වර්ගඵලය* |
| මි.මී. 1.5 | වර්ග සෙ.මී. 120 නොඉක්මවන |
| මි.මී. 3 | වර්ග සෙ.මී. 120 ඉක්මවන |

## III වන උපලේඛනය

7(2) වන නියෝගය

| *අයිතමය* | *පළතුරු යුෂ අන්තර්ගතය* |
|---|---|
| තනුක කිරීමෙන් තොරව පිළිගැන්වීම සඳහා සූදානම් කළ පළතුරු බීම/පාන වර්ග | පළතුරු යුෂය බර අනුව බරෙහි ප්‍රතිශතය 5% m/mකට වඩා නොඅඩු වන පරිදි |

| *අයිතමය* | *පළතුරු යුෂ අන්තර්ගතය* |
|---|---|
| * තනුක කිරීමෙන් තොරව පරිභෝජනය සඳහා සූදානම් කළ පළතුරු නෙක්ටා | පළතුරු යුෂය බර අනුව බරෙහි ප්‍රතිශතය 15% m/mකට වඩා නොඅඩු වන පරිදි |
| තනුක කිරීමෙන් තොරවූ ෆෘට් ක්‍රෂ්, කෝඩියල්, ස්කොෂ් හෝ සිරප් | පළතුරු යුෂය බර අනුව බරෙහි ප්‍රතිශතය 25% m/mකට නොඅඩු වන පරිදි |
| තනුක කිරීමෙන් තොර වූ පළතුරු සාන්ද්‍රණ | පළතුරු යුෂය බර අනුව බරෙහි ප්‍රතිශතය 45% m/mකට නොඅඩු වන පරිදි |

* දෙහි සහ ලෙමන් සඳහා 0.5% ක අවම ආම්ලිකතාවයකට ළඟා වීමට ප්‍රමාණවත් වන පළතුරු යුෂ අන්තර්ගතයක් තිබිය යුතු ය.

## **IV** වන උපලේඛනය

4 (6), 12(4) වන නියෝගය

### පෝෂණය පිළිබඳ වන ලේබල් කිරීම

පෝෂ්‍ය පදාර්ථ පිළිබඳ ප්‍රකාශය

1. පෝෂ්‍ය පදාර්ථ පිළිබඳ ප්‍රකාශය

1.1 පහත සඳහන් ආහාර සඳහා පෝෂ්‍ය පදාර්ථ පිළිබඳ ප්‍රකාශය අනිවාර්ය විය යුතු යඃ

1.1.1. පෝෂණ හෝ සෞඛ්‍යය පිළිබඳව හිමිකම් ඉදිරිපත් කරන්නා වූ ආහාර;

1.1.2. ළදරුවන්, කුඩා ළමයින් සහ ගර්භනී මව්වරුන් සඳහා විශේෂයෙන්ම සාදන ලද්දා වූ ආහාර; සහ

1.1.3. විශේෂ ආහාර භාවිතයන් සඳහා වන ආහාර සඳහා සහ විශේෂ වෛද්‍ය අවශ්‍යතාවයන් සඳහා වන ආහාර.

1.2 අනෙකුත් සියලු ආහාර සඳහා පෝෂණ පදාර්ථ පිළිබඳ ප්‍රකාශය ස්වේච්ඡාවෙන් සිදු කළ යුතු ය. පෝෂ්‍ය පදාර්ථ පිළිබඳ ප්‍රකාශය, සියලුම ආහාර නිෂ්පාදන සඳහා මෙම නියෝග *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දිනයේ සිට අවුරුදු දෙකක කාලසීමාවක් ඉකුත්වීමෙන් පසුව අනිවාර්ය විය යුතු ය.

2. පෝෂ්‍ය පදාර්ථ ලැයිස්තුගත කිරීම

2.1. ඉහත සඳහන් I වන වගන්තිය පරිදි පෝෂ්‍ය පදාර්ථ පිළිබඳ ප්‍රකාශය අදාළ කර ගනු ලබන අවස්ථාවකදී, පහත සඳහන් කරුණු ප්‍රකාශයට පත් කිරීම අනිවාර්ය වේ.

2.1.1. ශක්ති ජනක අගය;

2.1.2. ප්‍රෝටීන්, සම්පූර්ණ සීනි (ස්වභාවිකව හටගන්නා සහ එකතු කළ සීනි) ලබාගත හැකි කාබෝහයිඩ්‍රේට් (එනම්, ආහාරමය තන්තු හැර ආහාරමය කාබෝහයිඩ්‍රේට්), ආහාරමය තන්තු, සම්පූර්ණ මේදය, සංතෘප්ත මේදය, ට්‍රාන්ස් මේදය සහ සෝඩියම් ප්‍රමාණයන්;

2.1.3. ලේබලය මත පෝෂණ හිමිකමක් සහ/හෝ සෞඛ්‍යය හිමිකමක් සහ/හෝ නිර්දේශයක් සිදු කරනු ලැබ ඇති වෙනයම් පෝෂ්‍ය පදාර්ථයක ප්‍රමාණය; සහ

2.1.4. යහපත් පෝෂණ තත්ත්වයක් පවත්වා ගැනීම සඳහා අදාළ වන බවට සලකනු ලැබිය හැකි වෙනත් යම් පෝෂ්‍ය පදාර්ථයක ප්‍රමාණය.

2.2. මේද අම්ල ප්‍රමාණය සහ/හෝ වර්ගය හෝ කොලොස්ටරෝල් ප්‍රමාණය, පිළිබඳ ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවකදී, සංතෘප්ත මේද අම්ල, ඒක අසංතෘප්ත මේද අම්ල සහ බහු අසංතෘප්ත මේද අම්ල සහ කොලොස්ටරෝල් ප්‍රමාණයන් ප්‍රකාශයට පත් කළ යුතු අතර, 4.6 වන වගන්තියට අනුකූලව සහ 2.1 වගන්තියේ නියම කිරීම්වලට අතිරේකව, ට්‍රාන්ස් මේද අම්ල ප්‍රමාණය ප්‍රකාශ කිරීම අවශ්‍ය වේ.

2.3. 2.1, සහ 2.2 යටතේ වූ අනිවාර්ය ප්‍රකාශවලට අතිරේකව, පහත සඳහන් උපමානයන්ට අනුකූලව, විටමින් සහ ඛනිජ ලවණ ලැයිස්තුගත කරනු ලැබිය හැකි යඃ

2.3.1. ලබාගත යුතු ප්‍රමාණයන්, නිර්දේශ කර ස්ථාපිත කරනු ලැබූ විටමින් සහ ඛනිජ ලවණ පමණක් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

2.3.2. පෝෂ්‍ය පදාර්ථ ප්‍රකාශයට පත් කරනු ලබන විටදී, ග්‍රෑම් 100කට හෝ මි.ලී. 100කට හෝ ලේබලය මත ප්‍රමාණිකව සඳහන් කර ඇති පරිදි, එක් වරකට බෙදිය හැකි ප්‍රමාණය, නිර්දේශිත පෝෂක අගයෙන් 5%කට අඩු ප්‍රමාණයකින් අඩංගු වන්නා වූ විටමින් සහ ඛනිජ ලවණ ප්‍රකාශයට පත් නොකළ යුතු ය.

3. පෝෂ්‍ය පදාර්ථ ගණනය කිරීම

3.1. ශක්ති ජනක අගය ගණනය කිරීම

පහත සඳහන් පරිවර්තන සාධක භාවිතයට ගනිමින්, ලැයිස්තුගත කළ යුතු ශක්ති ජනක අගය ගණනය කළ යුතු ය.

| | | |
|---|---|---|
| කාබෝහයිඩ්‍රේට | - | කිලෝ කැලරි 4/ග්‍රෑම් හෝ කිලෝ ජූල් 17/ග්‍රෑම් |
| ප්‍රෝටීන් | - | කිලෝ කැලරි 4/ග්‍රෑම් හෝ කිලෝ ජූල් 17/ග්‍රෑම් |
| මේදය | - | කිලෝ කැලරි 9/ග්‍රෑම් හෝ කිලෝ ජූල් 37/ග්‍රෑම් |
| කාබනික අම්ල | - | කිලෝ කැලරි 3/ග්‍රෑම් හෝ කිලෝ ජූල් 13/ග්‍රෑම් |

**3.2.** ප්‍රෝටීන් ගණනය කිරීම

පහත සඳහන් සූත්‍රය භාවිතයට ගනිමින්, ලැයිස්තුගත කළ යුතු ප්‍රෝටීන් ප්‍රමාණය ගණනය කළ යුතු ය.

ප්‍රෝටීන් = මුළු kjeldahl නයිට්‍රජන් ප්‍රමාණය x පරිවර්තන සාධකය

අදාළ කරගනු ලබන ආහාරය සඳහා වූ විශ්ලේෂණ ක්‍රමවේදය මගින් වෙනස් සාධකයක් ලබාදී ඇත්තේ නම් මිස, පරිවර්තන සාධකයේ අගය 6.25 විය යුතු ය.

4. පෝෂ්‍ය පදාර්ථ අන්තර්ගතය ඉදිරිපත් කිරීම

4.1. පෝෂ්‍ය පදාර්ථ අන්තර්ගතය, සංඛ්‍යාත්මකව ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය:

එසේ වුවද, වෙනත් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයන්ද බැහැර කරනු නොලැබිය යුතු ය.

4.2. ශක්ති ජනක අගය පිළිබඳ තොරතුරු, ග්‍රෑම් 100කට හෝ මි.ලී. 100කට හෝ ඇසුරුමේ තනි පුද්ගලයකු සඳහා වන කොටසක් පමණක් අඩංගු වන්නේ නම් එක් ඇසුරුමකට, කිලෝ කැලරි සහ/හෝ කිලෝ ජූල්වලින් සඳහන් කරනු ලැබිය යුතුය. තවද, ලේබලය මත සංඛ්‍යාත්මකව ප්‍රකාශ කර ඇති පරිදි එක් අයෙකුට එක් වරකට බෙදිය හැකි ප්‍රමාණය වශයෙන් හෝ අඩංගු වන කොටස් ගණන, ඇසුරුමේ සඳහන් කර ඇති විටෙක, ප්‍රමාණය වශයෙන් තොරතුරු ලබා දිය යුතු ය.

4.3. ආහාරවල අඩංගු වන ප්‍රෝටීන්, කාබෝහයිඩ්‍රේට් සහ මේද ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු, ග්‍රෑම් 100කට සහ/හෝ මි.ලී. 100කට හෝ ඇසුරුමේ තනි පුද්ගලයකු සඳහා වන කොටසක් පමණක් අඩංගු වන්නේ නම්, එක් ඇසුරුමකට ග්‍රෑම්වලින් සඳහන් කරනු ලැබිය යුතු ය. තවද, ලේබලය මත සංඛ්‍යාත්මකව ප්‍රකාශ කර ඇති පරිදි එක් අයෙකුට එක් වරකට ලබාදිය හැකි ප්‍රමාණය වශයෙන් හෝ අඩංගු වන කොටස් ගණන, ඇසුරුමේ සඳහන් කර ඇති විටෙක, ප්‍රමාණය වශයෙන් තොරතුරු ලබා දිය යුතු ය.

4.4 විටමින් සහ ඛනිජ ලවණ පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු, මෙට්‍රික් ඒකකවලින් සහ/හෝ ඇසුරුමේ තනි පුද්ගලයකු සඳහා වන කොටසක් පමණක් අඩංගු වන්නේ නම්, එක් ඇසුරුමකට බැගින් හෝ ග්‍රෑම් 100ක් හෝ මි.ලී. 100ක් සඳහා වන නිර්දේශිත පෝෂක අගයෙන් ප්‍රතිශතයක් වශයෙන් සඳහන් කරනු ලැබිය යුතු ය. තවද, ඇසුරුමේ අඩංගු කොටස් සංඛ්‍යාව සඳහන් කර ඇත්තේ නම්, ලේබලය මත සංඛ්‍යාත්මකව ප්‍රකාශ කර ඇති පරිදි එක් අයෙකුට එක් වරකට ලබාදිය හැකි ප්‍රමාණය වශයෙන් හෝ එක් අයෙකුට හිමිවන ප්‍රමාණය වශයෙන් මෙම තොරතුරු ලබා දිය යුතු ය. තවද, ප්‍රෝටීන් සහ අතිරේක පෝෂ්‍ය පදාර්ථ පිළිබඳ තොරතුරු, නිර්දේශිත පෝෂක අගයෙන් තහවුරු කරන ලද අවස්ථාවකදී, එකී නිර්දේශිත පෝෂක අගයේ ප්‍රතිශතයක් වශයෙන්ද පැහැදිලිව සඳහන් කරනු ලැබිය හැකි ය.

මේ නියෝගවල V වන උපලේඛනයේ ලබාදී ඇති නිර්දේශිත පෝෂක අගය, වයස මාස 36කට වඩා වැඩි තැනැත්තන් වශයෙන් හඳුනාගත් සාමාන්‍ය ජනගහනය සඳහා විය යුතු ය. සමස්තයක් වශයෙන් සෞඛ්‍යාරක්ෂිත ආහාර වේලක් ලබා ගැනීමට දායක වන්නා වූ තේරීම් සිදු කිරීමට පාරිභෝගිකයන්ට සහාය වීමට ලේබල් කිරීමේ කාර්යයන් සඳහා එම කරුණු භාවිත කළ යුතු ය.

4.5 ලබාගත හැකි කාබෝහයිඩ්‍රේට (ආහාරමය තන්තුවලින් තොර කාබෝහයිඩ්‍රේට) අන්තර්ගතය, "කාබෝහයිඩ්‍රේට්" යනුවෙන් ලේබලය මත ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය. කාබෝහයිඩ්‍රේට් වර්ගය ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති අවස්ථාවකදී, මුළු කාබෝහයිඩ්‍රේට අන්තර්ගතය ප්‍රකාශයට පත් කිරීමට ඉක්බිතිව ම, පහත දැක්වෙන ආකෘතියට අනුව එය සඳහන් කරනු ලැබිය යුතු ය :-

"කාබෝහයිඩ්‍රේට් ග්‍රෑම් ............................ක ඇති සීනි ග්‍රෑම් ............................"
වෙනයම් කාබෝහයිඩ්‍රේට් සංරචකයක නිශ්චිත නාමය "X" මගින් නිරූපණය කරනු ලබන විටදී, ඊට පහතින්, පහත සඳහන් පරිදි සඳහන් කරනු ලැබිය යුතු ය.

"X" ග්‍රෑම් ....................................................

4.6 මේද අම්ල ප්‍රමාණය සහ/හෝ වර්ගය හෝ කොලෙස්ටරෝල් ප්‍රමාණය ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, මුළු මේදය ප්‍රමාණය ප්‍රකාශයට ඉක්බිතිව ම 4.3 කොටසට අනුකූලව, මෙම ප්‍රකාශය සඳහන් කරනු ලැබිය යුතුය.

ඒ සඳහා පහත සඳහන් ආකෘතිය භාවිතයට ගනු ලැබිය යුතු ය.

| | |
|---|---|
| මුළු මේදය ප්‍රමාණය | ග්‍රෑම් ................................................................................ |
| එයින් සංතෘප්ත මේද අම්ල | ග්‍රෑම් ................................................................................ |
| ට්‍රාන්ස් මේද අම්ල | ග්‍රෑම් ................................................................................ |
| ඒක අසංතෘප්ත මේද අම්ල | ග්‍රෑම් ................................................................................ |
| බහු අසංතෘප්ත මේද අම්ල | ග්‍රෑම් ................................................................................ |
| කොලෙස්ටරෝල් | මිලිග්‍රෑම් ................................................................................ |

5. ඔරොත්තු දීමේ හැකියාවන් සහ අනුකූලතාවය

5.1 මහජන සෞඛ්‍ය කටයුතු, භාවිතයට ගන්නා තෙක් තබා ගත හැකි කාලසීමාව, විශ්ලේෂණයේ නිරවද්‍යතාව, සැකසුම් විචලනය හා නිෂ්පාදනයේ පෝෂ්‍ය පදාර්ථවලට ආවේණික වූ බැඳීම් සහ විචලනතාවයට අදාළව සහ පෝෂ්‍ය පදාර්ථ එකතු කර ඇත්තේද හෝ නිෂ්පාදනයේ ස්වභාවිකවම හට ගන්නේද යන්නට අනුව ඔරොත්තු දීමේ සීමාවන් නියම කරනු ලැබිය යුතු ය.

5.2 පෝෂ්‍ය පදාර්ථ පිළිබඳ ප්‍රකාශයේ භාවිතයට ගත් අගයන්, ලේබල් කරන ලද නිෂ්පාදනය නිරූපණය කරන්නා වූ නිෂ්පාදනවල විශ්ලේෂණයන්ගෙන් නිශ්චිතවම ලබාගත් දත්ත වලින් ව්‍යුත්පන්න වූ සාමාන්‍ය අගයන් විය යුතු ය.

6. නිෂ්පාදනයේ ලේබලය මත දිස්විය යුතු මූලික පෝෂණ තොරතුරු පැනලය සඳහා ආකෘතිය

| *දර්ශීය අගයන්* | *ග්‍රෑම් 100ට (ඝන ද්‍රව්‍ය සම්බන්ධයෙන්) මිලිලීටර් 100ට (දියර සම්බන්ධයෙන්)* | *එක පිළිගැන්වීමක් සඳහා* |
|---|---|---|
| ශක්තිය | කිලෝජුල් - KJ | කිලෝජුල් - KJ |
| | කිලෝ කැලරි - kcal | කිලෝ කැලරි - kcal |
| මුළු කාබෝහයිඩ්රේට් | ග්‍රෑම් - g | ග්‍රෑම් - g |
| ආහාරමය තන්තු | ග්‍රෑම් - g | ග්‍රෑම් - g |
| මුළු සීනි | ග්‍රෑම් - g | ග්‍රෑම් - g |
| ස්වභාවිකව හටගන්නා සීනි | ග්‍රෑම් - g | ග්‍රෑම් - g |
| එකතු කළ සීනි | ග්‍රෑම් - g | ග්‍රෑම් - g |
| ප්‍රෝටීන් | ග්‍රෑම් - g | ග්‍රෑම් - g |
| මුළු මේදය | ග්‍රෑම් - g | ග්‍රෑම් - g |
| සංතෘප්ත මේද අම්ල | ග්‍රෑම් - g | ග්‍රෑම් - g |
| මොනො-අන්සැචියුරේටඩ් (ඒක අසංතෘප්ත) මේද අම්ල | ග්‍රෑම් - g | ග්‍රෑම් - g |
| බහු අසංතෘප්ත මේද අම්ල | ග්‍රෑම් - g | ග්‍රෑම් - g |
| ට්‍රාන්ස් මේද අම්ල | ග්‍රෑම් - g | ග්‍රෑම් - g |
| කොලොස්ටරෝල් | මිලි ග්‍රෑම් - mg | මිලි ග්‍රෑම් - mg |
| සෝඩියම් (Na) | මිලි ග්‍රෑම් - mg | මිලි ග්‍රෑම් - mg |

එක් පිළිගැන්වීමක් සඳහා ප්‍රමාණය ............. ග්‍රෑම් හෝ මිලි ලීටර

ඇසුරුමකට පිළිගැන්වීම් ගණන ..................

## V වන උපලේඛනය

12(5)(අ),
12(6)(ආ)(ඇ), 12(10)(ඇ) වන නියෝගය

### පෝෂ්‍ය පදාර්ථ පිළිබඳ සඳහන් කිරීමේ අගය (NRV)

පහත සඳහන් දෙවැදෑරුම් වූ පෝෂ්‍ය පදාර්ථ පිළිබඳ සඳහන් කිරීමේ අගයන්ගෙන් මේවා සමන්විත විය යුතු ය.

නිර්දේශිත පෝෂක අගයන් - අවශ්‍යතා (NRVs-R)

නිර්දේශිත පෝෂක අගයන් - බෝනොවන රෝග (NRVs-NCD)

එක් දිනක් සඳහා පෝෂ්‍ය පදාර්ථ පිළිබඳ සඳහන් කිරීමේ අගයන් - (NRVs-R)

| | |
|---|---|
| ප්‍රෝටීන් (ග්‍රෑම් -g) | 50 |
| විටමින් A (මයික්‍රො ග්‍රෑම් -μg)* | 800 |
| විටමින් D (මයික්‍රො ග්‍රෑම් -μg)* | 5 |
| විටමින් C (මිලි ග්‍රෑම් -mg) | 100 |
| තයමින් (මිලි ග්‍රෑම් - mg) | 1.2 |
| රයිබොෆ්ලේවින් (මිලි ග්‍රෑම් - mg) | 1.2 |
| නයසීන් (මිලි ග්‍රෑම් - mg)** | 15 |
| විටමින් $B_6$ (මිලි ග්‍රෑම් - mg) | 1.3 |
| ෆෝලේට් (මයික්‍රො ග්‍රෑම් - μg)*** | 400 |
| විටමින් $B_{12}$ (මයික්‍රො ග්‍රෑම් - μg) | 2.4 |
| බයෝටීන් (මයික්‍රො ග්‍රෑම් - μg) | 30 |
| පැන්ටොතනේට් (මිලි ග්‍රෑම් - mg) | 5 |
| විටමින් K (මයික්‍රො ග්‍රෑම් - μg) | 60 |
| විටමින් E ( මිලි ග්‍රෑම් - mg) | 9 |
| කැල්සියම් (මිලි ග්‍රෑම් - mg) | 1000 |
| මැග්නීසියම් (මිලි ග්‍රෑම් - mg) | 310 |
| යකඩ (මිලි ග්‍රෑම් - mg) | 22 |
| සින්ක් (මිලි ග්‍රෑම් - mg) | 15 |
| අයඩීන් (මයික්‍රො ග්‍රෑම් - μg) | 150 |
| තඹ (මයික්‍රො ග්‍රෑම් - μg) | 900 |
| සෙලනියම් (මයික්‍රො ග්‍රෑම් - μg) | 60 |
| පොටෑසියම් (මිලි ග්‍රෑම් - mg) | 3500 |
| සෝඩියම් (මිලි ග්‍රෑම් - mg) | 2000 |
| ක්ලෝරයිඩ් (මිලි ග්‍රෑම් - mg) | 3400 |
| පොස්පරස් (මිලි ග්‍රෑම් - mg) | 700 |
| මැන්ගනීස් (මිලි ග්‍රෑම් - mg) | 3 |
| ෆ්ලෝරයිඩ් (මිලි ග්‍රෑම් - mg) | 3.5 |
| ක්‍රෝමියම් (මයික්‍රො ග්‍රෑම් - μg) | 120 |
| මොලිබ්ඩිනම් (මයික්‍රො ග්‍රෑම් - μg) | 45 |
| ආහාරමය තන්තු (ග්‍රෑම් - g) | 30 |

නයසීන්, ෆෝලේට් සහ විටමින් A සමකාරකයන් සඳහා පරිවර්තන සාධක :-15

| *විටමින්* | *විටමින් සඳහා සමකාරකයන්* | | *ආහාරමය සමකාරකයන්* |
|---|---|---|---|
| නයසීන් | නයසීන් මිලි ග්‍රෑම් 1කට සමකාරකයන් (NE) | = | නියැසීන් මිලි ග්‍රෑම් 1<br>ට්‍රිප්ටොෆෑන් මිලි ග්‍රෑම් 60 |
| ෆෝලේට් | ආහාරමය ෆෝලේට් මයික්‍රො ග්‍රෑම් 1කට සමකාරකයන් (DFE) | = | මයික්‍රො ග්‍රෑම් 1ක් වූ ආහාර ෆෝලේට්<br>ආහාරවලට එකතු කරන ලද්දා වූ හෝ අතිරේකයක් ලෙස ආහාර සමඟ පරිභෝජනයට ගන්නා වූ ෆෝලික් අම්ල මයික්‍රො ග්‍රෑම් 0.6 |

| *විටමින්* | *විටමින් සඳහා සමකාරකයන්* | | *ආහාරමය සමකාරකයන්* |
|---|---|---|---|
| | | | හිස්බඩ අතිරේකයක් ලෙස ලබාගන්නා වූ ෆෝලික් අම්ල මයික්‍රො ග්‍රෑම් 0.5 |
| විටමින් A | රෙටිනෝල් සමකාරකයන් (RAE) මයික්‍රො ග්‍රෑම් 1ක ක්‍රියාකාරී (RAE) | = | රෙටිනෝල් මයික්‍රො ග්‍රෑම් 1<br>බීටා කැරොටීන් මයික්‍රො ග්‍රෑම් 12<br>වෙනත් ප්‍රෝ-විටමින් A<br>කැරොටිනොයිඩ මයික්‍රො ග්‍රෑම් 24 |
| | හෝ | | |
| | මයික්‍රො ග්‍රෑම් 1ක රෙටිනෝල් සමකාරකයන් (RE) | = | රෙටිනෝල් මයික්‍රො ග්‍රෑම් 1<br>බීටා කැරොටින් මයික්‍රො ග්‍රෑම් 6<br>වෙනත් ප්‍රෝ-විටමින් A<br>කැරොටිනොයිඩ<br>මයික්‍රො ග්‍රෑම් 12 |

නිර්දේශිත පෝෂක අගයන් - බෝනොවන රෝග
(NRVs-NCD)

| | |
|---|---|
| සංතෘප්ත මේද අම්ල | ග්‍රෑම් 20 |
| සෝඩියම් | මිලි ග්‍රෑම් 2000 |

* RAE හෝ RE ක්‍රියාකාරී රෙටිනෝල් සමකාරකයන් හෝ රෙටිනෝල් සමකාරකයන්
** NE - නයසීන් සමකාරකයන්
*** DEF - ආහාරමය ෆෝලේට් සමකාරකයන්

## **VI** වන උපලේඛනය

12(5)(ආ) සහ (ඇ) නියෝග

### පෝෂක සහ සෞඛ්‍යය හිමිකම් පෑම භාවිතය පිළිබඳ විස්තරාත්මක සටහන

1. පෝෂක පිළිබඳව සංසන්දනාත්මක හිමිකම් පෑම

පහත සඳහන් කොන්දේසිවලට යටත්ව සහ ලේබලය මත භාවිතය සඳහා වන උපදෙස්වලට අනුව පරිභෝජනය කිරීම සඳහා තවදුරටත් සකස් කිරීමට අවශ්‍ය වීම පිළිබඳව සැලකිල්ලට ගනිමින්, අලෙවි කරන ලද ආහාර මත පදනම්ව, පෝෂක පිළිබඳව සංසන්දනාත්මක හිමිකම්පෑම සඳහා අවසර ලබා දෙනු ලැබිය යුතු ය.

සංසන්දනය කිරීමට බඳුන්වන්නා වූ ආහාර, එකම ආහාරයේ විවිධ ස්වරූපයන් හෝ ඒ හා සමාන ආහාර විය යුතු ය. සංසන්දනය කිරීමට බඳුන්වන්නා වූ ආහාර, පැහැදිලිව හඳුනා ගනු ලැබිය යුතු ය.

ශක්ති ජනක අගය හෝ පෝෂක අන්තර්ගතය වෙනස්වන ප්‍රමාණය පිළිබඳව ප්‍රකාශයක් ලබා දෙනු ලැබිය යුතු ය.

සංසන්දනාත්මක හිමිකම් පෑමට ආසන්නයේ පහත සඳහන් තොරතුරු ප්‍රකාශ කරනු ලැබිය යුතුය.

(අ) එකී ප්‍රමාණයටම අදාළව වෙනස්වන ප්‍රමාණය, ප්‍රතිශතයක් වශයෙන්, භාග වශයෙන් හෝ පූර්ණ සංඛ්‍යාවක් වශයෙන් පැහැදිලිව ඉදිරිපත් කළ යුතු ය. සංසන්දනය කිරීම පිළිබඳ සියලු විස්තර ලබා දෙනු ලැබිය යුතු ය.

(ආ) ආහාරය සංසන්දනයට බඳුන්වන්නා වූ ආහාරයේ (ආහාරවල) අනන්‍යතාව, පාරිභෝගිකයන් හට පහසුවෙන් හඳුනාගත හැකි යම් ආකාරයකින් ආහාර(ය) පිළිබඳ විස්තර කරනු ලැබිය යුතු ය.

ශක්තිය හෝ මහා පෝෂක සහ සෝඩියම් පිළිබඳව වන සංසන්දනාත්මක ප්‍රකාශයන් සිදු කිරීමේ දී එම සංසන්දනය, සංසන්දනය කරනු ලබන ආහාර වර්ග අතර පිළිවෙළින් ශක්ති ජනක අගයේ හෝ පෝෂක අන්තර්ගතයේ, අවම වශයෙන් 30%ක සාපේක්ෂ වෙනසක් මත සහ VII වන උපලේඛනයේ "මූලාශ්‍රය" ලෙස හෝ "අඩු" ලෙස නිශ්චය කර ඇති අගයට සමාන ශක්ති ජනක අගය හෝ පෝෂක අන්තර්ගතයේ අවම සම්පූර්ණ වෙනස මත පදනම් විය යුතු ය. සෝඩියම් හැර, වෙනත් ක්ෂුද්‍ර පෝෂක පිළිබඳව සංසන්දනාත්මක ප්‍රකාශ සිදු කිරීමේ දී එම සංසන්දනය, සංසන්දනය කළ ආහාර අතර අවම වශයෙන් නිර්දේශිත පෝෂක අගයෙන් 10%ක වෙනසක් මත පදනම් විය යුතු ය.

**සෞඛ්‍යය හිමිකම් පෑම්**

පෝෂණය සහ සෞඛ්‍ය හිමිකම් පෑම ඇගයීම සඳහා, පිළිගත් වෘත්තීයමය මණ්ඩල විසින් සම්සුරු තුල්‍ය සමාලෝචනයට ලක් වූ හෝ සම්සුරු/තුල්‍ය සමාලෝචනයට ලක් වූ විද්‍යාත්මක ජර්නල් සඟරාවල පළ කරන ලද ලේඛන පමණක් පිළිගනු ලැබිය යුතු ය. ඉහත සඳහන් උපමාන සම්පූර්ණ නොකරන්නා වූ සමාගම් පාදක කරගත් පර්යේෂණ කරුණු මේ සඳහා පිළිගනු නොලැබිය යුතු ය.

පහත සඳහන් සියලු කොන්දේසි සම්පූර්ණ කරන්නා වූ අවස්ථාවක දී, සෞඛ්‍යය හිමිකම් සඳහා අවසර ලබා දෙනු ලැබිය යුතු ය.

සෞඛ්‍යය හිමිකම් පිළිබඳ ප්‍රකාශයන් පහත සඳහන් කොටස් දෙකකින් සමන්විත විය යුතු ය.

(i) පෝෂක පදාර්ථයේ භෞතවේදීය කාර්යභාරය හෝ යම් පිළිගත් ආහාර- සෞඛ්‍ය සම්බන්ධතාවක් පිළිබඳ තොරතුරු; සහ

(ii) පර්යේෂණ මගින් ආහාරයේ නිශ්චිත සංඝටකවලට සම්බන්ධතාවක් නොපෙන්වන්නා වූ සමස්ත ආහාරය හෝ ආහාර මත පදනම් වූ සම්බන්ධතාවක් පිළිබඳව මිස, පෝෂ්‍ය පදාර්ථයක හෝ පිළිගත් ආහාර - සෞඛ්‍ය සම්බන්ධතාවක භෞතවේදීය කාර්ය භාරයට අදාළව නිෂ්පාදනයේ සංයුතිය පිළිබඳ තොරතුරු.

## VII වන උපලේඛනය

12(5)(ආ) සහ (ඇ) වන නියෝග

**පෝෂක අන්තර්ගතයන් සඳහා කොන්දේසි**

| *සංඝටකය* | *හිමිකම* | *කොන්දේසි* |
|---|---|---|
| ශක්තිය | අඩු | ග්‍රෑම් 100ක කි.කැලරි 40කට (කි.ජූල් 170) නොවැඩි (ඝන ද්‍රව්‍ය) |
| | | මි.ලී. 100ක කි.කැලරි 20කට (කි.ජූල් 80) නොවැඩි (දියරයන්) |
| | රහිත | මි.ලී. 100ක කි.කැලරි 4කට නොවැඩි වන (දියරයන්) |
| | අඩු කළ* | ආහාරයෙහි මුළු ශක්ති ජනක අගයෙන් එම ආහාරය අඩු කරන ලද ලක්ෂණ (ය) හැඟවීමක් සමග ශක්ති ජනක අගයෙන් අවම වශයෙන් 30% අඩු කරන ලද |

| *සංඝටකය* | *හිමිකම* | *කොන්දේසි* |
|---|---|---|
| මේදය | අඩු | ග්‍රෑම් 100ක ග්‍රෑම් 3කට නොවැඩි වන (ඝන ද්‍රව්‍ය)**<br>මි.ලී.100ක ග්‍රෑම් 1.5කට නොවැඩි (දියරයන්) |
| | රහිත | ග්‍රෑම් 100ක (ඝන ද්‍රව්‍ය) හෝ මි.ලී. 100කට (දියරයන්) ග්‍රෑම් 0.5කට නොවැඩි *** |
| සංතෘප්ත මේදය**** | අඩු | ග්‍රෑම් 100ක ග්‍රෑම් 1.5කට නොවැඩි (ඝන ද්‍රව්‍ය)<br>මි.ලී.100ක ග්‍රෑම් 0.75කට නොවැඩි (දියරයන්) |
| | රහිත | ග්‍රෑම් 100ක ග්‍රෑම් 0.1කට නොවැඩි (ඝන ද්‍රව්‍ය)<br>මි.ලී.100ක ග්‍රෑම් 0.1කට නොවැඩි (දියරයන්) |
| | අඩුකළ | සමාන නිෂ්පාදනයක ඇති සංතෘප්ත මේද අම්ල සහ ට්‍රාන්ස් මේද අම්ල ප්‍රමාණයට සහ වෙනත් නිෂ්පාදනයක ඇති ට්‍රාන්ස් මේද අම්ල අන්තර්ගතයට සමාන හෝ ඊට අඩු ට්‍රාන්ස් මේද අම්ල ප්‍රමාණයකට වඩා අවම වශයෙන් 30%කින් සංතෘප්ත මේද අම්ල සහ ට්‍රාන්ස් මේද අම්ල ප්‍රමාණය අඩු. |
| කොලොස්ටරෝල් **** | අඩු | ග්‍රෑම් 100ක ග්‍රෑම් 0.02කට නොවැඩි (ඝන ද්‍රව්‍ය)<br>මි.ලී. 100ක ග්‍රෑම් 0.01කට නොවැඩි (දියරයන්) |
| | රහිත | ග්‍රෑම් 100ක ග්‍රෑම් 0.005කට නොවැඩි (ඝන ද්‍රව්‍ය)<br>මි. ලී. 100ක ග්‍රෑම් 0.005කට නොවැඩි (දියරයන්) |
| සීනි | අඩු | ග්‍රෑම් 100ක ග්‍රෑම් 5කට නොවැඩි (ඝන ද්‍රව්‍ය)<br>මි.ලී. 100ක ග්‍රෑම් 2.5කට නොවැඩි (දියරයන්) |
| | රහිත | ග්‍රෑම් 100ක ග්‍රෑම් 0.5කට නොවැඩි (ඝන ද්‍රව්‍ය)<br>මි.ලී. 100ක ග්‍රෑම් 0.5කට නොවැඩි (දියරයන්) |
| | සීනි එකතුකර නොමැති | එකතු කරන ලද මොනෝ-හෝ ඩයි-සැකරයිඩ් හෝ පැණිරස කිරීම සඳහා භාවිත කරනු ලබන වෙනත් යම් ආහාරයක් අඩංගු නැති ආහාරයේ ස්වභාවිකවම සීනි පවතින්නේ නම්, ලේබලය මත "ස්වභාවිකවම පවතින සීනි අඩංගු" යන්න සඳහන් කළ යුතු ය. |
| සෝඩියම් | අඩු | ග්‍රෑම් 100ක හෝ මි.ලී. 100ක ග්‍රෑම් 0.12කට නොවැඩි |
| | ඉතා අඩු | ග්‍රෑම් 100ක හෝ මි.ලී. 100ක ග්‍රෑම් 0.04කට නොවැඩි |
| | රහිත | ග්‍රෑම් 100ක ග්‍රෑම් 0.005කට නොවැඩි |
| ප්‍රෝටීන් | ප්‍රභවය | ග්‍රෑම් 100ක NRV අවම වශයෙන් 10% (ඝනද්‍රව්‍ය),<br>මි.ලී. 100කට NRV අගයෙන් අවම වශයෙන් 5% (දියරයන්) හෝ කි.කැ. 100කට NRV අගයෙන් අවම වශයෙන් 5% හෝ එක් පිළිගැන්වීමක දී NRV අගයෙන් අවම වශයෙන් 10% |

| *සංඝටකය* | *හිමිකම* | *කොන්දේසි* |
|---|---|---|
| | අධි | "ප්‍රභවය" සඳහා වන අගය මෙන් දෙගුණයක් |
| විටමින් සහ ඛනිජ ලවණ | ප්‍රභවය | ග්‍රෑම් 100ක NRV අගයෙන් අවම වශයෙන් 15% (ඝන ද්‍රව්‍ය), මි.ලී. 100ක NRV අගයෙන් අවම වශයෙන් 7.5% (දියරයන්) හෝ එක් පිළිගැන්වීමක දී NRV අගයෙන් අවම වශයෙන් 15% හෝ කි.කැ. 100කට NRV අගයෙන් අවම වශයෙන් 5% |
| | අධි | "ප්‍රභවය" සඳහා වන අගය මෙන් දෙගුණයක් |
| ආහාරමය තන්තු | ප්‍රභවය | ග්‍රෑම් 100ක අවම වශයෙන් ග්‍රෑම් 3 හෝ කි.කැ. 100ක ග්‍රෑම් 1.5 හෝ එක් පිළිගැන්වීමක දී NRV අගයෙන් 10% |
| | අධි | ග්‍රෑම් 100ක අවම වශයෙන් ග්‍රෑම් 6 හෝ කි.කැ. 100ක ග්‍රෑම් 3 හෝ එක් පිළිගැන්වීමක දී NRV අගයෙන් 20% |
| ඔමෙගා 3 - මේද අම්ල | ප්‍රභවය | ග්‍රෑම් 100ක සහ කි.කැ. 100ක අවම වශයෙන් ඇල්ෆා ලිනොලෙනික් අම්ලයෙන් ග්‍රෑම් 0.3 හෝ ග්‍රෑම් 100ක සහ කි.කැ. 100ක ඊකෝසපෙන්ටේනොයික් අම්ල (EPA) සහ ඩොකොසහෙක්සනොයික් අම්ල (DHA) ප්‍රමාණයන්ගෙන් අවම වශයෙන් මි. ග්‍රෑම් 40 |
| | අධි/සරු | "ප්‍රභවය" සඳහා වන අගය මෙන් දෙගුණයක් |
| ඒකඅසංතෘප්ත මේදය | අධි | ඒක අසංතෘප්ත මේදය මගින් නිෂ්පාදනයේ ශක්තියෙන් 20%කට වැඩි ප්‍රමාණයක් සපයන්නා වූ තත්ත්වය යටතේ මේද අම්ල වලින් අවම වශයෙන් 45%ක් ඒක අසංතෘප්ත මේදවලින් ව්‍යුත්පන්න වන |
| බහු අසංතෘප්ත මේදය | අධි | බහු අසංතෘප්ත මේදය මගින් නිෂ්පාදනයේ ශක්තියෙන් 20%කට වැඩි ප්‍රමාණයක් සපයන්නා වූ තත්ත්වය යටතේ මේද අම්ලවලින් අවම වශයෙන් 45%ක් බහු අසංතෘප්ත මේදවලින් ව්‍යුත්පන්න වන. |
| අසංතෘප්ත මේදය | අධි | අසංතෘප්ත මේදය මගින් නිෂ්පාදනයේ ශක්තියෙන් 20% කට වැඩි ප්‍රමාණයක් සපයන්නා වූ තත්ත්වය යටතේ මේද අම්ලවලින් අවම වශයෙන් 70%ක් අසංතෘප්ත මේදවලින් ව්‍යුත්පන්න වන. |

* "අඩු කළ ශක්තිය" - සංසන්දනය කළ හැකි නිෂ්පාදන පවතින අවස්ථාවල දී පමණක්

** මේද රහිත කිරිපිටි නිදහස් කරනු ලැබේ.

*** මෙම වගන්තිය, දියර පොල් නිෂ්පාදන සඳහා අදාළ නොවේ.

**** සංතෘප්ත මේදය හා කොලොස්ටරෝල් පිළිබඳ වන හිමිකම් සඳහන් වන අවස්ථාවල දී, අදාළ වන පරිදි, ට්‍රාන්ස් මේද අම්ල සැලකිල්ලට ගනු ලැබේ.

## VIII වන උපලේඛනය

12(10)(ආ) වන සහ (ඉ) වන නියෝග

ආහාරවලට එකතු කරනු ලැබිය හැකි අවසරලත් විටමින් වර්ග, ඛනිජ ලවණ, ඇමයිනෝ අම්ල, මේද අම්ල, නියුක්ලියෝටයිඩ ලැයිස්තුව

**විටමින් වර්ග**

විටමින් A
ප්‍රෝවිටමින් A
විටමින් D ($D_2$ හා $D_3$)
විටමින් E
විටමින් $K_1$
විටමින් $B_1$
විටමින් $B_2$
නියැසීන්
පැන්ටොතනික් අම්ලය
විටමින් $B_6$
ෆෝලික් අම්ලය
විටමින් $B_{12}$
බයොටීන්
විටමින් C
කෝලයින්
ඉනොසිටෝල්

**ඛනිජ ලවණ**

කැල්සියම්
පොස්පරස්
මැග්නීසියම්
අයන්
කොපර්
අයඩීන්
සින්ක්
මැංගනීස්
සෝඩියම්
පොටෑසියම්
සෙලනියම්
ක්‍රෝමියම්
මොලිබ්ඩිනම්
ෆ්ලෝරයිඩ්
ක්ලෝරයිඩ්

**ඇමයිනෝ අම්ල**

අයිසොලියුසින්
ලියුසීන්
ලයිසීන්
මෙතියොනීන්
ෆීනයිල් ඇලනීන්
ත්‍රියොනයින්
ට්‍රිප්ටොෆෑන්
වැලීන්
හිස්ටිඩීන්
ආර්ජිනින්
ටයිරොසයින්
සිස්ටීන්
සිස්ටයින්
ඇලනීන්
ඇස්පාටික් අම්ලය
සිට්‍රුලයින්
ග්ලූටමික් අම්ලය
ග්ලූටමයින්
ග්ලයිසීන්
ඕනිතීන්
ප්‍රෝලීන්
සෙරින්
කානිටින්
ටෝරින්

**මේද අම්ල**

ලිනොලෙයික් අම්ලය
ඇල්ෆා - ලිනොලෙයික් අම්ලය
අරාකිඩොනික් අම්ලය
ඩොකොසහෙක්සනොයික් අම්ලය (DHA)
ඊකොසපෙන්ටනොයික් අම්ලය (EPA)

**නියුක්ලියෝටයිඩ**

ඇඩිනොසයින් 5ʹ මෙනෝෆොස්පේට් (AMP)
සයිටිඩීන් 5ʹ මොනෝෆොස්පේට් (CMP)
ගුවානොසයින් 5ʹ මොනෝෆොස්පේට් (GMP)
යූරිඩීන් 5ʹ මෙනෝෆොස්පේට් (UMP)
ඉනොසීන් 5ʹ මෙනෝෆොස්පේට් (IMP)

**IX වන උපලේඛනය**

13 වන නියෝගය

**අ ආකෘති පත්‍රය**

**ආහාර නිෂ්පාදනයක සෞඛ්‍ය පිළිබඳ ප්‍රකාශයන් සම්බන්ධ වෙළෙඳ දැන්වීම සඳහා වන ඉල්ලුම් පත්‍රය**

- ආහාර නිෂ්පාදනයේ පොදු නාමය:...................................................................................
- ආහාර නිෂ්පාදනයේ සන්නාමය හෝ වෙළෙඳ නාමය :- ..............................................................

1. ඉල්ලුම්කරු* (නිෂ්පාදකයා/ඇසුරුම්කරු/බෙදාහරින්නා/ආනයනකරු) :
සමාගමේ නම: ..................................................................................................................................
ඉල්ලුම්කරුගේ නම: ..........................................................................................................
ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය:
ලිපිනය:
දුරකථන අංකය: ජංගම දුරකථන අංකය:
විද්‍යුත් තැපැල් ලිපිනය:

2. වෙළෙඳ දැන්වීම් ප්‍රචාරණ ආයතනය හෝ ආයතන: (එක් ආයතනයකට වඩා වැඩි නම් වෙනම ලැයිස්තුවක් අමුණන්න*
ආයතනයේ නම: ...........................................................................................................................................
සම්බන්ධ කරගන්නා තැනැත්තාගේ නම : ..........................................................................................................
සම්බන්ධ කරගන්නාගේ ජාතික හැඳුනුම්පත් අංකය:
ලිපිනය:
දුරකථන අංකය: ජංගම දුරකථන අංකය:
විද්‍යුත් තැපැල් ලිපිනය:

3. අනුමතය ඉල්ලා සිටින වෙළෙඳ දැන්වීමේ ඇතුළත් වන ප්‍රකාශ :
(i) …
(ii) …
(iii) …
(iv) …

4. ආහාර නිෂ්පාදනයේ නිෂ්පාදකයා (ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත නිෂ්පාදන සඳහා පමණි)
නම:
ලිපිනය:
දුරකථන අංකය: ජංගම දුරකථන අංකය:
විද්‍යුත් තැපැල් ලිපිනය:

5. ප්‍රභවය වූ රට (ආනයනය කළ නිෂ්පාදන සඳහා පමණි) :-.........................................................

6. වෙළෙඳ දැන්වීමේ (ක්‍රමය) :-

| | *ක්‍රමය* | *ඔව්* | *නැත* |
|---|---|---|---|
| I | වීඩියෝ | | |
| II | ඩිස්ක් ජොකි (DJ) ඇතුළුව ශ්‍රවණ මාධ්‍ය | | |
| III | නිශ්චල/ ස්ලයිඩ් (slide)/ මුද්‍රිත/ දැන්වීම් පුවරු | | |

7. වෙළෙඳ දැන්වීම ප්‍රදර්ශනය කරනු ලබන මාධ්‍යයන්ගේ නම්:

| | *මාධ්‍යය* | *නම / නම්* |
|---|---|---|
| I | රූපවාහිනිය | |
| II | ගුවන්විදුලිය | |
| III | ප්‍රවෘත්ති පත්‍ර | |
| IV | සමාජ මාධ්‍ය | |
| V | වෙනත් මාධ්‍ය | දැන්වීම් පුවරු, දැන්වීම් එලක, පෝස්ටර්, අත්පත්‍රිකා, විස්තර පත්‍රිකා, වෙනත් (නිශ්චිතව සඳහන් කරන්න) ………… |

8. වෙළෙඳ දැන්වීම ප්‍රචාරය කිරීමේ භාෂා (කරුණාකර හරි ලකුණ යොදන්න)

සිංහල ☐ දෙමළ ☐ ඉංග්‍රීසි ☐

9. අවශ්‍ය ලේඛන සහ වෙනත් ද්‍රව්‍ය:

| | *ලේඛන සහ වෙනත් ද්‍රව්‍ය* | *ඔව්* | *නැත* |
|---|---|---|---|
| 1. | කතා පුවරුවල සහතික කළ පිටපත් හයක් (6) | | |
| 2. | ශ්‍රව්‍ය - දෘශ්‍ය (අදාළ වන්නේ නම්) සහතික කළ පිටපත් හයක් (6) | | |
| 3. | ගුවන්විදුලි ප්‍රචාරය සඳහා වන පිටපත්වල සහතික කළ පිටපත් හයක් (6) (අදාළ වන්නේ නම්) | | |
| 4. | මුද්‍රිත මාධ්‍ය සඳහා වෙළෙඳ දැන්වීමේ කෙටුම්පතේ සහතික කළ පිටපත් හයක් (6) (අදාළ වන්නේ නම්) | | |
| 5. | සම්යුරු සමාලෝචනයට බඳුන් කරන ලද තාක්ෂණික/ පර්යේෂණ ලේඛන තිබේ නම් ඒවායේ සහතික කළ පිටපත් හයක් (6) | | |
| 6. | ලේබලයේ සඳහන් කරන ලද පරිදි සංඝටක ලැයිස්තුව | | |
| 7. | ස්වාධීන පිළිගත් රසායනාගාරයකින් ලබාගත් සංයුති විශ්ලේෂණ වාර්තාව | | |
| 8. | වෙනත් යම් අදාළ ලේඛන (කරුණාකර නිශ්චිතව සඳහන් කරන්න) උදා:- NMRA ලිපිය | | |
| 9. | ඉල්ලුම් කිරීමේ ගාස්තුව ගෙවීමේ ලදුපත (පොදු 172) | | |
| 10. | ප්‍රධාන විධායක නිලධරයා විසින් ඉල්ලුම්කරුට අවසර ලබාදෙනු ලබන නිල ලිපිය | | |

දිනය :-..........................................

.......................................................

ඉල්ලුම්කරුගේ අත්සන*
ජාතික හැඳුනුම්පත් අංකය,
සමාගම් මුද්‍රාව

*ප්‍රධාන විධායක නිලධරයා (CEO) හෝ ප්‍රධාන විධායක නිලධරයා විසින් බලය පවරන ලද නිලධරයා

| ඉල්ලුම්පත්‍ර අංකය |
|---|

කාර්යාලීය භාවිතය සඳහා පමණි

**ආ ආකෘති පත්‍රය**

| යොමු අංකය |
|---|
| ඉල්ලුම්පත්‍ර අංකය |

**ආහාර නිෂ්පාදනයක සෞඛ්‍ය පිළිබඳ ප්‍රකාශ සහ පෝෂ්‍ය පදාර්ථවල කර්තව්‍ය පිළිබඳ ප්‍රකාශ අන්තර්ගත වන වෙළෙඳ දැන්වීම් සඳහා අනුමතය ලබා දීමේ ලිපිය**

.......................................................................... (සමාගමේ නම සහ ලිපිනය) හි ............................................ ජාතික හැඳුනුම්පත් අංක දරන ............................................ මයා/ මිය (ඉල්ලුම්කරුගේ නම) යන අය වෙත සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි යන භාෂාවෙන්/ භාෂාවලින් ඉදිරිපත් කරන ලද වෙළෙඳ දැන්වීමට/ කතා පුවරුවට (අමුණන ලද සහතික කරන ලද පිටපත) දැඩි ලෙස අනුකූල වෙමින්, පහත සඳහන් කරනු ලබන ප්‍රකාශ(ය) සමඟ පමණක් .................................... (මාධ්‍යය)යේ ............................. (සන්නාමය/ වෙළෙඳ නාමය) යන සන්නාමයේ ....................................... (පොදු නාමය) ආහාර ද්‍රව්‍යය වෙළෙඳ ප්‍රචාරණය කිරීම සඳහා මෙම දිනයේ දී මෙයින් අනුමතය ලබාදෙනු ලැබේ.

අනුමත කරන ලද ප්‍රකාශ

1. .................
2. .................
3. .................
4. .................

මෙම අනුමතය ලබා දීමේ ලිපිය, නිකුත් කළ දිනයේ සිට වසර තුනක් (3)ක් දක්වා වලංගු වන අතර, එය ..................... දිනැති අංක ................ දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1980 අංක 26 දරන ආහාර පනත යටතේ සාදනු ලැබූ 2022 ආහාර (ලේබල් කිරීමේ සහ ප්‍රචාරය කිරීමේ) නියෝගවල නියම කර ඇති කොන්දේසිවලට යටත් වනු ලැබිය යුතු ය.

ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ලද සහ අනුමතය ප්‍රදානය කරන ලද නිෂ්පාදනයේ සංයුතියට, පෝෂණයේ ප්‍රතිඵලයට, අන්තර්ගතයට, වෙළෙඳ දැන්වීමේ හෝ කතා පුවරුවේ භාෂාවට සහ ආකෘතියට අවසර නොලත් යම් වෙනස්කමක් සිදු කරනු ලබන්නේ නම්, මෙම අනුමතය ලබා දීමේ ලිපිය ශුන්‍ය සහ බලරහිත විය යුතු ය.

නිකුත් කළ දිනය :-

ප්‍රධාන ආහාර බලධරයා/ ආහාර පාලනය පිළිබඳ පරිපාලනය භාර අධ්‍යක්ෂ

**ඇ ආකෘති පත්‍රය**

| යොමු අංකය |
|---|
| මුල් ඉල්ලුම්පත්‍ර අංකය |

**ආහාර සඳහා වෙළෙඳ දැන්වීමක් සම්බන්ධයෙන් ප්‍රදානය කරන ලද අනුමතය අලුත් කරවා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රය**

| | | |
|---|---|---|
| 1. | ආහාර අයිතමයේ පොදු නාමය | |
| 2. | ආහාර අයිතමයේ සන්නාමය/ වෙළෙඳ නාමය | |
| 3. | කලින් අනුමතය ප්‍රදානය කරන ලද දිනය | |
| 4. | කලින් ප්‍රදානය කරන ලද අනුමතයේ කාලය ඉකුත් වන දිනය | |
| 5. | අලුත් කිරීමේ ගාස්තුව ගෙවන ලද ලදුපත් අංකය (පොදු 172) (කරුණාකර ලදුපත අමුණන්න) | |
| 6. | ප්‍රධාන විධායක නිලධරයා විසින් ඉල්ලුම්කරුට අවසර ලබා දෙනු ලබන නිල ලිපිය | |

1. ඉල්ලුම්කරු* (නිෂ්පාදකයා/ ඇසුරුම්කරු/ බෙදාහරින්නා/ ආනයනකරු)

සමාගමේ නම:
ඉල්ලුම්කරුගේ නම:
ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය:
ලිපිනය:
දුරකතන අංකය: ජංගම දුරකතන අංකය:
විද්‍යුත් තැපැල් ලිපිනය:

2. වෙළෙඳ දැන්වීම් ප්‍රචාරණ ආයතනය හෝ ආයතන: (එක් ආයතනයකට වඩා වැඩි නම් වෙනම ලැයිස්තුවක් අමුණන්න)

නම:
සම්බන්ධ කරගන්නා තැනැත්තාගේ නම:
සම්බන්ධ කරගන්නා තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත් අංකය:
ලිපිනය:
දුරකතන අංකය: ජංගම දුරකතන අංකය:
විද්‍යුත් තැපැල් ලිපිනය:

3. ආහාර නිෂ්පාදනයේ නිෂ්පාදකයා (ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත නිෂ්පාදන සඳහා පමණි)
නම:
ලිපිනය:
දුරකතන අංකය: ජංගම දුරකතන අංකය:
විද්‍යුත් තැපැල් ලිපිනය:

4. ප්‍රභවය වූ රට (ආනයනය කළ නිෂ්පාදන සඳහා පමණි)

5. වෙළෙඳ දැන්වීමේ (ක්‍රමය) :-

| | *ක්‍රමය* | *ඔව්* | *නැත* |
|---|---|---|---|
| I | වීඩියෝ | | |
| II | ඩිස්ක් ජොකි (DJ) ඇතුළුව ශ්‍රවණ මාධ්‍ය | | |
| III | නිශ්චල/ ස්ලයිඩ් (slide)/ මුද්‍රිත | | |

6. වෙළෙඳ දැන්වීම ප්‍රදර්ශනය කරනු ලබන මාධ්‍යයන්ගේ නම්:

| | *මාධ්‍යය* | *නම / නම්* |
|---|---|---|
| I | රූපවාහිනිය | |
| II | ගුවන්විදුලිය | |
| III | පුවත්පත් පත්‍ර | |
| IV | සමාජ මාධ්‍ය | |
| V | වෙනත් මාධ්‍ය | දැන්වීම් පුවරු, දැන්වීම් ඵලක, පෝස්ටර්, අත්පත්‍රිකා, විස්තර පත්‍රිකා වෙනත් (නිශ්චිතව සඳහන් කරන්න) ………… |

7. වෙළෙඳ දැන්වීම ප්‍රචාරය කිරීමේ භාෂා (කරුණාකර හරි ලකුණ යොදන්න)

සිංහල ☐ දෙමළ ☐ ඉංග්‍රීසි ☐

අවසන් වරට ලබාදුන් අනුමතයේ සිට නිෂ්පාදනයේ සංයුතියට සහ වෙළෙඳ දැන්වීමේ ආකෘතියට කිසිදු වෙනසක් සිදු කර නොමැති බවට මෙයින් සහතික වන අතර ඉහත සඳහන් කරන ලද වෙළෙඳ දැන්වීම සඳහා ලබාදෙන ලද අනුමතය අලුත් කරවා ගැනීම සඳහා ඉල්ලා සිටිමු.

...........................................................
ඉල්ලුම්කරුගේ අත්සන
ජාතික හැඳුනුම්පත් අංකය
සමාගම් මුද්‍රාව

දිනය : ............................

* ප්‍රධාන විධායක නිලධරයා (CEO) හෝ ප්‍රධාන විධායක නිලධරයා විසින් බලය පවරන ලද නිලධරයා

**ඈ පරිශිෂ්ටය**

**ගාස්තු**

1. ඉල්ලුම්පත්‍රය සඳහා වන සැකසුම් ගාස්තුව- එක් එක් භාෂාව සඳහා - රු. 25,000/- (ආපසු ගෙවනු නොලැබේ)

2. වෙළෙඳ දැන්වීමේ සංශෝධිත පිටපත (නැවත ඉදිරිපත් කිරීම) සඳහා වන සැකසුම් ගාස්තුව - රු.25,000/- (ආපසු ගෙවනු නොලැබේ)

3. අනුමතය ලබා දීමේ ලිපිය නිකුත් කිරීම සඳහා වන ගාස්තුව -

| | *වෙළෙඳ දැන්වීමේ ක්‍රමය* | *රුපියල්* |
|---|---|---|
| I | වීඩියෝ | රු. 100,000.00 |
| II | ඩිස්ක් ජොකි (DJ) ඇතුළුව ශ්‍රවණ මාධ්‍ය | රු. 75,000.00 |
| III | නිශ්චල/ ස්ලයිඩ් (slide)/ මුද්‍රිත / දැන්වීම් පුවරු | රු. 50,000.00 |

4. අනුමතය ලබාදීමේ ලිපිය අලුත් කිරීම සඳහා වන ගාස්තුව - රු. 50,000/-
අනුමතය ලබාදීමේ ලිපිය අලුත් කරවා ගැනීම සඳහා වන ඉල්ලුම්පත්‍රය, අනුමතය ලබාදීමේ ලිපියේ වලංගු කාලය ඉකුත් වීමට මාස හයකට (6) පෙර ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

5. මුල් පිටපතට හානි වී හෝ අස්ථානගත වී ඇත්තේ නම්, අනුමතය ලබාදීමේ ලිපියේ අනුපිටපතක් සඳහා රු. 2000/- ක ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු අතර එකී අනුමතය ලබාදීමේ ලිපියේ පිටපත මත "අනුපිටපතකි" යන වචනය සඳහන් කරනු ලැබිය යුතු ය.

2022.12.09.